වාර්ෂික වාර්තාව
2021

ජල සම්පත් මණ්ඩලය
ජල සම්පාදන අමාත්‍යාංශය

පටුන

	පිටු අංකය
හැඳින්වීම	04
දැක්ම	05
මෙහෙවර	05
අරමුණු	06
කාර්යයන්	06
ආයතනික තොරතුරු	07
ආයතනික පාලන ව්‍යූහය පෙර ගමන්කරුවන් විගණන හා කළමනාකරණ කමිටුව ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	08
කාර්යය මණ්ඩල තොරතුරු	09
ප්‍රධාන ක්‍රියාකාරකම්	11
2021 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්	12
මූල්‍ය ප්‍රකාශනය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය භාණ්ඩාගාර ප්‍රදාන අනාවරණය කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයට සටහන්	31
විගණකාධිපති වාර්තාව	50
විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම	63
2021 ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියේ සාරාංශ	70

හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් පාලනය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුණු පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් පුළුල්ව ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන්හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාළ කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සංශෝධනය කරන ලදී.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර අංක 2010/23 අනුව දක්වන ලද කටයුතු සඳහා ස්වභාවික ජල උල්පත් හා භූගත ජලය භාවිතා කිරීමට ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම ලබා ගත යුතු බව නියම කරන ලදී.

දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම.

මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු/ අධිකාරී/ ආයතන/ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශීය මෙන්ම විදේශීය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබාදීම.

අරමුණු

- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම
- භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම
- භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම
- භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- භූගත ජල සම්පත් තක්සේරු කිරීම
- වෙනත් ආයතන හා සම්බන්ධවී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම

කාර්යයන්

- භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා පවතින දත්තයන්හි භූ විද්‍යාත්මක අදහස් දැක්වීම
- භූගත ජල සම්පත ගවේෂණය පිණිස භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම
- භූගත ජල විභවයන් පවතින ස්ථාන හඳුනා ගැනීම
- භූගත ජල මූලාශ්‍ර පවතින ස්ථාන හා ඒවායේ විභවයන් හා ගුණාත්මක බව විද්‍යාත්මක ලෙස නිර්ණය කිරීම
- භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සදහා ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම
- රසායනික හා භෞතික ලක්ෂණ හදුනාගැනීම සදහා මෙන්ම ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ සදහා ද ජල නියැඳියන් විශ්ලේෂණය කිරීම
- භූ ජල දත්ත එක්රැස් කිරීම භූගත ජල දත්ත රැස්කර පවත්වාගෙන යාම සහ භූ ජල සිතියම් පිළියෙල කිරීම

ආයතනික තොරතුරු

ආයතනය
ජල සම්පත් මණ්ඩලය

නෛතික තත්ත්වය
රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

ස්ථාපිත වර්ෂය
1966 දී 1964 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත මඟින් 1999 දී, 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත මගින් ඉහත පනත සංශෝධනය කරන ලදී.

ප්‍රධාන කාර්යාලය
2021.01.01 සිට 2021.07.19
අංක 02 ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07

2021.07.20 සිට 2021.12.31
288/12විල්, රෝයල් ගාඩ්න්ස්,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

දුරකථන: +94 11 2694835, +94 11 2697050
ෆැක්ස්: +94 11 2669517 (පාලන)
ඊමේල්: helpdesk@wrb.gov.lk
වෙබ්: www.wrb.gov.lk

රේඛීය අමාත්‍යාංශය
ජල සම්පාදන අමාත්‍යාංශය

බදු හඳුනාගැනීමේ අංකය
409018017

එ.අ.බ. ලියාපදිංචි අංකය
409018017 - 7000

බැංකුකරුවන්
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ආදායම් බදු උපදේශක
ARS ඇසෝසියේට්
(වරලත් ගණකාධිකාරී)

විගණකවරුන්
විගණකාධිපති දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ජල සම්පාදන අමාත්‍යාංශය)
අභ්‍යන්තර විගණක (ජල සම්පත් මණ්ඩලය)

අධ්‍යක්ෂක මණ්ඩලය
ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා - සභාපති
සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා - අධ්‍යක්ෂ
ආර්.කේ.එල්.ජාගොඩ මිය - භාණ්ඩාගාර නියෝජිත

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්
ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න මහතා
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)
අතිරේක ලේකම්
ජල සම්පාදන අමාත්‍යාංශය
පී.පී.එස්.ආර්.කේ.පතිරණ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
2021.02.18 දින විශ්‍රාම යන ලදී.
එම්.ඒ.පුෂ්පකුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
ආර්.එම්.එස්.රත්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (භූජල)
කේ.එම්.යු.සී.බී. කුලතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
ඩී.ජී.එස්. වික්‍රම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
ජේ. විජේසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)
2021.09.21 දින විශ්‍රාම යන ලදී.
ආර්.ආර්.ජී.ආර්. රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

ආයතනික පාලන ව්‍යුහය

පෙර ගමන්කරුවන්

ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා - සභාපති
සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා - අධ්‍යක්ෂ
ආර්.කේ.එල්.ජාගොඩ මිය - භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හයක් (06) පවත්වන ලදී .

විගණන හා කළමනාකරණ කමිටුව

i. ආර්.කේ.එල්.ජාගොඩ මිය - සභාපති - භාණ්ඩාගාර නියෝජිත
ii. සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
iii. එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
iv. ඊ.ඒ.ඩී.පී.ප්‍රසන්න මහතා - නිරීක්ෂක - රජයේ විගණන අංශය
v. එස්.ඩබ්.ගුණවර්ධන මිය - නිරීක්ෂක - ජල සම්පාදන අමාත්‍යාංශය

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2021 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් - 2021 වර්ෂය

i. ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න මහතා - සාමාන්‍යාධිකාරී (වැඩ බලන), අතිරේක ලේකම් ජල සම්පාදන අමාත්‍යාංශය
ii. පී.පී.එස්.ආර්.කේ.පතිරණ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) 2021.02.18 දින විශ්‍රාම යන

2021.12.31 දිනට කාර්යය මණ්ඩලය

වැටුප් තලය	අනුමත කාර්යය මණ්ඩලය ස්ථිර	වර්තමාන කාර්යය මණ්ඩලය ස්ථිර
HM	11	06
MM	47	35
JM	27	09
MA	92	55
PL	236	160
එකතුව	**413**	**265**



2021.12.31 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

තනතුර	වැටුප් තලය	අනුමත සේවක මණ්ඩලය	වර්තමාන සේවක මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	HM	1	0	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	HM	3	1	2
සහකාර සාමාන්‍යාධිකාරී	HM	7	5	2
පළාත් කළමනාකරු	MM	5	0	5
භූජල විද්‍යාඥ / ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ	MM	24	23	1
ඉංජිනේරු (යාන්ත්‍රික)	MM	1	0	1
ඉංජිනේරු (සිවිල්)	MM	2	1	1
රසඥ	MM	7	7	0
කළමනාකරු (විදුම්)	MM	3	1	2
අභ්‍යන්තර විගණක	MM	1	1	0
ගණකාධිකාරී	MM	1	1	0
කළමනාකරු (පාලන)	MM	1	1	0
කළමනාකරු (ප්‍රසම්පාදන)	MM	1	0	1
නීති නිලධාරී	MM	1	0	1
ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක	JM 1-1	1	0	1
පුද්ගලික සහකාර - සභාපති	JM 1-1	1	1	0
පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී	JM 1-1	1	1	0
පාලන නිලධාරී	JM 1-1	2	1	1
ගිණුම් නිලධාරී	JM 1-1	1	1	0
ප්‍රවාහන / ප්‍රවර්ධන නිලධාරී	JM 1-1	1	0	1
පරිසර නිලධාරී	JM 1-1	1	1	0
විගණන නිලධාරී	JM 1-1	1	1	0
පුස්ථකාලාධිපති	JM 1-1	1	0	1
තොරතුරු තාක්ෂණ නිලධාරී	JM 1-1	1	1	0
ඉංජිනේරු සහකාර (සිවිල්)	JM 1-1	4	0	4
ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික)	JM 1-1	2	0	2
ගබඩා අධිකාරී	JM 1-1	1	0	1
ප්‍රසම්පාදන නිලධාරී	JM 1-1	1	1	0
විදුම් අධිකාරී	JM 1-1	6	1	5
ප්‍රගති අධීක්ෂණ නිලධාරී	JM 1-1	1	0	1
සැලසුම් නිලධාරී සහකාර	JM 1-1	1	0	1
තාක්ෂණික සහකාර (සිවිල්)	MA 2-2	7	1	6
තාක්ෂණික සහකාර (යාන්ත්‍රික)	MA 2-2	6	5	1
සහකාර විදුම් අධිකාරී	MA 2-2	14	8	6
සැලසුම් ශිල්පී	MA 2-2	4	0	4
ජල විශ්ලේෂක	MA 2-2	10	09	1
වැඩ පරීක්ෂක	MA 2-2	2	1	1
වැඩපල පරීක්ෂක	MA 2-2	2	0	2
පද්ධති ක්‍රියාකරු	MA 2-2	1	1	0
ගිණුම් සහකාර	MA 2-2	2	2	0
ගබඩා භාරකරු	MA 2-2	3	3	0
තොරතුරු තාක්ෂණ ශිල්පී	MA 2-2	1	1	0
කළමණාකරණ සහකාර	MA 2-1	2	2	0
කළමණාකරණ සහකාර	MA 1-2	37	22	16
ආරක්ෂක නිලධාරී / සහකාර	MA 1-2	1	0	1
විදුම් යාන්ත්‍රික ශිල්පී රියදුරු	PL 3	7	0	7
මේසන්	PL 3	3	2	1
ජල නල කාර්මික	PL 3	4	0	4
රියදුරු	PL 3	50	35	15
වෑල්දම් ශිල්පී / පෑස්සුම් ශිල්පී	PL 3	3	2	1
මෝටර් කාර්මික	PL 3	2	1	1
පට්ටල්කරු / පෑස්සුම් ශිල්පී	PL 3	1	1	0
විදුලි කාර්මික	PL 3	1	0	1
මෝටර් විදුලි කාර්මික	PL 3	1	0	1
තහඩු වැඩ ශිල්පී / පින්තාරු ශිල්පී	PL 3	2	0	2
බර යන්ත්‍ර ක්‍රියාකරු	PL 3	2	0	2
විදුම් යන්ත්‍ර ක්‍රියාකරු සහ රියදුරු	PL 3	7	3	4
විදුම් සහායක	PL 2	7	0	7
නඩත්තු සහායක	PL 2	3	2	1
සංචාරක නිවාස භාරකරු	PL 2	1	0	1
කම්කරු	PL 1	105	95	10
කාර්යාල සහායක	PL 1	23	09	14
ආරක්ෂක නිලධාරී	PL 1	14	10	04
එකතුව		**413**	**265**	**148**

ප්‍රධාන ක්‍රියාකාරකම්

නල ළිං ඉදිකිරීම





ජල ධාරිතා පරීක්ෂණ





භූජල පරීක්ෂණ



ජල සාම්පල පරීක්ෂණ





ජල සම්පත් මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්

(1). භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල නිමාන ව්‍යාපෘති සහ අධ්‍යයනය

1.1 භූගත ජල කළමනාකරණයට අවශ්‍ය දිගු කාලීන දත්ත එක් රැස් කිරීම සඳහා වූ වැඩසටහන (LTGM) (රු. මිලියන 3.0)

පරිසර හිතකාමී සහ තිරසාර අයුරින් ගෘහස්ත, කාර්මික සහ කෘෂිකාර්මික පරිභෝජනයට භූගත ජලය භාවිතා කිරීම සඳහා භූගත ජල කළමනාකරණය හා තක්සේරු කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් අදාල ප්‍රදේශය තුල දැනට පවතින භූගත ජල සම්පත්වල භාවිතය සහ ඒවායේ වර්තමාන තත්ත්වයන් සම්බන්ධව අධ්‍යනයකර ඒවායේ තිරසාර භාවිතයට අවශ්‍ය කළමනාකරණ සැලැස්ම සහ මාර්ගෝපදේශයන් ස්ථාපිත කළ යුතු වේ. එබැවින් මෙම කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනයන් සහ භූ ජල විද්‍යාත්මක දත්තයන් දීර්ඝකාලීනව එක් රැස් කිරීම වැදගත්වේ.

ඒ අනුව ජල සම්පත් මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ භූ ජල විද්‍යාත්මකව සංවේදි කලාප සඳහා දීර්ඝ කාලීනව භූගත ජල මට්ටම් විචලනය අධ්‍යනය කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය දීර්ඝකාලීන පුර්ණ භූගත ජලය අධීක්ෂණ ව්‍යාපෘති 8 ක සංකලනයක් වේ.

මෙම ව්‍යාපෘති ආරම්භයේදී, අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීම සඳහා ඒ ඒ අධ්‍යන ප්‍රදේශවල හදුනාගත් භූජල විද්‍යාත්මක ගැටළු සහිත ස්ථාන ආශ්‍රිතව පරීක්ෂණ නල ළිං ඉදිකිරීම සිදුකරන ලදී. එක් එක් අධ්‍යයනයේදී තෝරාගත් ජාලයේ භූගත ජල නිමාන කටයුතු කාර්තුමය වශයෙන් සිදු කරන ලද අතර ජල නියැදී එකතු කිරීම, ජලයේ තත්ත්ව විශ්ලේෂණය සහ භූගත ජල මට්ටම මැනීම සහ දත්ත පද්ධති ගත කිරීම ව්‍යාපෘතියේ වත්මන් ක්‍රියාකාරකම් වේ.

අධ්‍යයන ප්‍රදේශය	ක්‍රියාකාරකම්	2021 ඉලක්කය	2021 ප්‍රගතිය
කොළඹ - මිගමුව අනුරාධපුර වව්නියා - කිලිනොච්චි මන්නාරම යාපනය සහ දූපත් පුත්තලම කැළණි - ඉහළ ද්‍රෝණිය කැළණි ගඟ - පහළ ද්‍රෝණිය මොණරාගල පොළොන්නරුව ත්‍රිකුණාමලය කිරිඳිඔය අම්පාර මාතලේ	භූගත ජල නිමානය සහ ජල සාම්පල ස්ථානීයව පරීක්ෂා කිරීම (ස්ථාන 3440) සහ ජල සාම්පල එකතු කිරීම (පුර්ණ රසායනික විශ්ලේෂණ නියැදි 1720 හා බැර ලෝහ විශ්ලේෂණය නියැදි 395	3440 (ස්ථාන) 1720 (නියැදි) 395 (නියැදි)	74%
	ද්වි වාර්ෂික පුර්ණ ජල සාම්පල විශ්ලේෂණය සහ බැර ලෝහ විශ්ලේෂණය	1720 (නියැදි) 395 (නියැදි)	26%
	දත්ත විශ්ලේෂණය හා වාර්ෂික වාර්තා සැකසීම		60%



රූපය 01: LTGM ව්‍යාපෘති ප්‍රදේශ සිතියම සහ භූගත ජල නිමාන සහ ජල නියැදි එක් රැස් කිරීම

1.2 ශ්‍රී ලංකාවේ වෙරළබඩ භූගත ජලධර පද්ධතියට දේශගුණික විපර්යාස කෙරෙහි සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳ අධ්‍යයනය (රු. මිලියන 2.0)

අධ්‍යයන ප්‍රදේශය: කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන වෙරළබඩ භූගත ජලධරය සහ ත්‍රිකුණාමලය - මුලතිව් දක්වා දිවෙන වෙරළබඩ භූගත ජලධරය

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ දේශගුණික විපර්යාස හේතුවෙන් භූගත ජලයට සිදුවන බලපෑම අධ්‍යනය කිරීමයි. මෙම ව්‍යාපෘතියේ අරමුණු ලගා කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

❖ භූගත ජලනිමානය, ජල නියැදී එකතු කිරීම සහ ජල සාම්පල විශ්ලේෂණය

- 2015 සිට 2011 දක්වා කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව, වෙරළබඩ ජලධරයට මුහුදු ජලය ඇතුල් වීම හඳුනා ගැනීම සහ වෙරළබඩ ජලධරයට ඇති අනෙකුත් පාරිසරික බලපෑම හඳුනා ගැනීම, ඉදිකරන ලද නොගැඹුරු පරීක්ෂණ නල ළිං සහ පවත්නා නොගැඹුරු නල ළිං භාවිතයෙන් වැඩිදුර අධ්‍යනය කිරීම මෙහිදී සිදු කෙරේ. බටහිර වෙරළ තීරයෙහි සහ ත්‍රිකුණාමලය - මුලතිව් වෙරළ තීරයෙහි දත්ත එක් රැස් කිරීමේ ස්ථාන රූපය 02 මඟින් දැක්වේ.

- 2021 වර්ෂයේ දී බස්නාහිර වෙරළබඩ භූගත ජල ධරයට අදාල දත්ත එක් රැස් කිරීම මෝසම් වැසි වලට පෙර සහ පසු ලෙස වසර තුල අවස්ථා තුනකදී දත්ත එක් රැස් කරන ලදි. අවස්ථා තුනකදී ජල නියැදි වල ගුණාත්මක තත්ත්ව පරීක්ෂාව ක්ෂේත්‍රයේදී (EC, PH, TDS, Salinity යන පරාමිතීන්) හා අවස්ථා එකකදී ජල නියැදි සම්පූර්ණ රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි. (මුළු නියැදි ගණන 30) එසේම බැර ලෝහ විශ්ලේෂණය සඳහා ද ජල නියැදි එක් රැස් කරන ලදි (මුළු නියැදි ගණන 15). එසේම බස්නාහිර වෙරළබඩ ජලධරය සම්බන්ධ වැඩි දුර අධ්‍යනය සහ පරතරයන් (gap) පිරවීම සඳහා තවත් පරීක්ෂණ නළ ළිං 04 ක් ඉදිකර ජල ධාරිතා පරීක්ෂණයන් සිදු කරන ලදි.

- 2021 වර්ෂයේදී ත්‍රිකුණාමලය - මුලතිව් වෙරළබඩ ජලධරයේ දත්ත එක්රැස් කිරීම මෝසම් වැසි වලට පෙර සහ පසු ලෙස වසර තුල දත්ත එක්රැස් කරන ලදි. එකතු කරන ලද ජල නියැදි රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි (මුළු නියැදි ගණන 35). එසේම ත්‍රිකුණාමලය - මුලතිව් දක්වා දිවෙන වෙරළබඩ ජලධරය

සම්බන්ධ වැඩි දුර අධ්‍යනය සහ පරතරයන් (gap) පිරවීම සඳහා තවත් පරීක්ෂණ නළ ළිං 06 ක් ඉදිකරන ලදි.

- 2021 වර්ෂයේ සොයාගන්නා ලද දත්ත පදනම්ව, භූගත ජල මට්ටම නිමානය, ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය, නිමාන පද්ධතියේ පරතරයන් පිරවීම හා නිමාන පද්ධතිය ගාල්ල සිට තංගල්ල දක්වා පුළුල් කිරීම සඳහා පරීක්ෂණ ළිං ඉදිකිරීම් (10 ක්) හා එම ළිං සඳහා පොම්ප පරීක්ෂණ සිදුකිරීම 2021 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් සැලැස්ම වේ.



රූපය 02: අධ්‍යන ප්‍රදේශය (කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන වෙරළබඩ තීරය සහ ත්‍රිකුණාමලය - මුලතිව් දක්වා දිවෙන වෙරළබඩ තීරය)

මෙම ක්‍රියාකාරකම් යටතේ, 2021 වර්ෂයේ ඉලක්කය සහ ප්‍රගතිය පහත පරිදි වේ.

අධ්‍යයන ප්‍රදේශය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
■ කොළඹ සිට ගාල්ල වෙරළබඩ භූගත ජලධරය ■ ත්‍රිකුණාමලය - මුලතිව් වෙරළබඩ භූගත ජලධරය	භූ ජල සමීක්ෂණ සිදු කිරීම සහ පරීක්ෂණ නල ළිං ඉදිකිරීම (10)	10	90%
	භූගත ජල නිමානය සහ ජල සාම්පල ස්ථානීයව පරීක්ෂා කිරීම(ස්ථාන 260) සහ ජල සාම්පල එකතු කිරීම (පූර්ණ රසායනික විශ්ලේෂණ (නියැදි 130) හා බැර ලෝහ විශ්ලේෂණය (නියැදි 30)	260 (ස්ථාන) 130 (නියැදි) 30 (නියැදි)	71%
	ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම (10)	10	40%
	ද්වි වාර්ෂික පූර්ණ ජල සාම්පල විශ්ලේෂණය(130) සහ බැර ලෝහ විශ්ලේෂණය (30)	130 (නියැදි) 30 (නියැදි)	50%



රූපය 03: ව්‍යාපෘති ක්‍රියාකාරකම් (බස්නාහිර වෙරළබඩ ජල ධරය) - භූගත ජල මට්ටම් මැනීම, ජල සාම්පල එකතු කිරීම, ස්ථානීය ජල සාම්පල පරීක්ෂාව, පරීක්ෂණ නල ළිං ඉදිකිරීම හා ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම

1.3 මා ඔය ගංගා ද්‍රෝණියේ ජලධර ප්‍රතිආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම සඳහා සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යනය (රු. මිලියන 2.5)

ලංකාවේ පවතින වර්ෂාපතන රටාව, විවිධ ප්‍රදේශ වල පවතින භූ විද්‍යාතත්මක තත්ත්වයන් හා භූ ලක්ෂණ අනුව භූගත ජලය රඳවා පවත්වා ගැනීමේ හැකියාව වෙනස් වේ. ඒ අනුව වියළි කාලය තුළ භූගත ජලය අවම වන ප්‍රදේශයක් සහිත මා ඔය ජල ද්‍රෝණිය ජලධර ප්‍රතිආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම සඳහා සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී. මාඔය ද්‍රෝණියේ මැද කොටස වියළි කාලවලදී භූගත ජල හිඟයට මුහුණ දෙයි. ද්‍රෝණියේ ඉහළ කොටසට වසර පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන බැවින් ද්‍රෝණියේ මැද කොටස සඳහා කෘතිමව නැවත ආරෝපණය කිරීමේ ක්‍රමයක් සැලසුම් කිරීම වඩා සුදුසු වේ. මේ සඳහා සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කළ යුතු වේ. එක් රැස් කරන ලද තොරතුරු මත පදනම්ව, මා ඔය ද්‍රෝණිය තුළ ජලධර නැවත ආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනාගෙන අවසානයේ භූ ජල විද්‍යාත්මක සිතියමක් සකස් කෙරේ.

විශේෂිත අරමුණු :

- උල්පත්වල ජලය ගලා යාමේ සීඝ්‍රතාවය, උල්පත් වල සමාජ වටිනාකම, සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ උල්පත් වල ආරක්ෂණ නිර්ණායක සකස් කිරීම.
- ප්‍රදේශයේ ජලධර වර්ග සහ මායිම් හඳුනා ගැනීම මගින් භූ ජල විද්‍යාත්මක සිතියම් සකස් කිරීම
- වියළි කාලවලදී ජල හිඟය ඇති ප්‍රදේශ හඳුනා ගැනීම සහ කෘතිමව නැවත ආරෝපණය කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම.

2021 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

මූලික අධ්‍යයනය යටතේ සකස් කරන ලද සිතියම් මත පදනම්ව, ඒකමාන සහ ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ සිදු කිරීම සඳහා ස්ථාන තෝරා ගැනීම, තෝරාගත් ප්‍රදේශ වල ඒකමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ සහ ජල තත්ත්ව විශ්ලේෂණ සිදු කිරීම හා සමීක්ෂණය කරන ලද ස්ථාන වලින් පරීක්ෂණ ළිං කැණීම සඳහා ස්ථාන 06ක් තෝරා ගැනීම යන ක්‍රියාවලින් 2021 වර්ෂයේදී සිදු කරන ලදි.



රූපය 04: 2021 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම්

අධ්‍යයන ප්‍රදේශය	ක්‍රියාකාරකම්	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
■ මා ඔය ගංගා ද්‍රෝණියේ ජලධර ප්‍රතිආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම සඳහා සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යනය	මූලික අධ්‍යයනය (දත්ත එකතු කිරීම) සහ මා ඔය ද්‍රෝණියට අදාල සිතියම් සකස් කිරීම		100%
	ත්‍රෛමාසික ජල මට්ටම අධීක්ෂණය සහ විශ්ලේෂණය (260) , ද්විවාර්ෂික ජල නියැදි (රසායනික විශ්ලේෂණය සඳහා 130 සහ බැර ලෝහ විශ්ලේෂණය සඳහා 30)	260 (ස්ථාන) 130 (නියැදි) 30 (නියැදි)	80%
	ජලධර ව්‍යාප්තිය සහ භූගත ජල විභවයන් හඳුනා ගැනීම සඳහා භූ භෞතික විද්‍යා සමීක්ෂණ සිදු කිරීම (1D - 50 සහ 2D - 10)	50(D) 10(2D)	90%
	පරීක්ෂණ නළ ළිං ඉදි කිරීම (15)	15	-
	ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම (10) සහ ජලධර නැවත ආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම	10	-
	රසායනික විශ්ලේෂණය (රසායනික 150 සහ බැර ලෝහ 30)	150 30	-
	දත්ත විශ්ලේෂණය හා වාර්ෂික වාර්තා සැකසීම		30%

1.4. භූගත ජලයට අදාල පාරිසරික ගැටළු විසඳීම අවශ්‍ය ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම (රු. මිලියන 1.5)

පස්, බොරළු, මැටි, වැලි කැණීම හා ගල් කැඩීම නිසාත් භූගත ජලය අධික ලෙස ළිං වලින් පොම්ප කිරීම නිසාත් ඇතිවන භූගත ජල මට්ටම්වල අඩුවීම හා ජල දූෂණය යන පාරිසරික වෙනස්වීම් අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා අනෙකුත් සම්බන්ධිත ආයතනයන් හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යයන හා නිරීක්ෂණ සිදු කරනු ලැබේ. මේ යටතේ පුත්තලම, නුවරඑළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල, අනුරාධපුරය, කුරුණෑගල, ගම්පහ, කොළඹ, රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල මෙම පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම්	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
01	ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ හා පාරසරික ගැටළුවලට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම්	100	117%
02	භූගත ජල නියාමනයන්ට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	25	28 %

1.5 විද්‍යාත්මක හා වෙනත් ප්‍රාග්ධන කටයුතු වැඩි දියුණු කිරීම - (රු. මිලියන 4.0)

ඉහත වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් හා ඉලක්ක සම්පූර්ණ කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම්	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
01	ක්ෂේත්‍රයට ගෙන යා හැකි විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම - Portable multi parameter	01 කි	100%
02	ජල ධාරිතා පරීක්ෂණ සඳහා උපකරණ මිලදී ගැනීම - submersible pumps	03 කි	85%
03	රසායනාගාර හා භූ භෞතික උපකරණ නඩත්තු කිරීම	-	100%
04	ජල මට්ටම් මිනුම් කිරීම් උපකරණ මිලදී ගැනීම - portable water level recorder	02 කි	100%

1.6 කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් (රු. මිලියන 1.0)

ජල සම්පත් මණ්ඩලයේ කාර්යය මණ්ඩලයේ හැකියාව වර්ධනය කිරීම නව දැනුමක් ලබා දීම සඳහා 2021 කාර්යය මණ්ඩලය සඳහා පුහුණු කරන වැඩසටහන් සංවිධානය ලදි.

අනු අංකය	ක්‍රියාකාරකම්	2021 දී ප්‍රගතිය
01	WRB කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන	18%



රූපය 05: පුහුණු වැඩසටහන - “Contract administration & Procurements”

1.7. ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම - (රු. මිලියන 6.0)

ඉහත වැඩසටහන යටතේ පුත්තලම සහ අනුරාධපුර පළාත් කාර්යාලවල පහත වගුවේ පරිදි අදාල වැඩසටහන් සිදු කරන ලදී

අනු අංකය	ක්‍රියාකාරකම්	2021 දී ප්‍රගතිය
01	යන්ත්‍ර අළුත්වැඩියා කිරීම්	10%
02	අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ වහල අළුත්වැඩියා කිරීම	50%
03	අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ නිවස අළුත්වැඩියා කිරීම	60%
04	පුත්තලම පළාත් කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම	50%



රූපය 06: අනුරාධපුර පළාත් කාර්යාලයට අයත් නව ගොඩනැගිල්ල ඉදිකිරීම් අරම්භය



රූපය 07: අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ වහල අළුත්වැඩියා කිරීම

(2). අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සිදු කරන භූගත ජල සංවර්ධන ව්‍යාපෘතිය

2.1 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ හා සංරක්ෂණ සැලැස්ම සකස් කිරීම අදියර I සහ II (යාපනය අර්ධද්වීපයේ ළිං ඉන්වෙන්ටරි සකස් කිරීම සහ ජල විද්‍යාත්මක තක්සේරුව) (රු. මිලියන 2.34)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සපයනු ලබන අරමුදල් යටතේ ළිං ඉන්වෙන්ටරි සකස් කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර එය ඉදිරියටත් සිදු කරනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ 2021 දී සියලුම භූගත ජල ප්‍රභවයන් (නල ළිං සහ නොගැඹුරු වල ළිං) පරීක්ෂා කර අදාල දත්තයන් WRB දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. මෙය මූලික අධ්‍යයනයක් වන අතර එය යාපන අර්ධද්වීපයට ඉදිරි භූගත ජල කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට උපකාරී වනු ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම් ගණන	සම්පූර්ණ කරන ලද ග්‍රාම නිලධාරී වසම් ගණන	ළිං ගණන
කරෙයිනගර්	09	09	3,095
සන්දිලිපායි	28	28	17,797
තෙල්ලිපලෙයි	43	43	19,478
උදුවිල්	30	29	14,620
යාපනය	28	24	7,336
වෙලානායි	30	15	4,803
නල්ලූර්	40	35	18,638
කයිට්ස්	15	-	840
ඩෙල්ෆ්	06	05	450
මුරුතන්කනෙයි	17	-	400
චාවකච්ඡේරි	60	60	23,123
කරවෙඩ්ඩිය	35	17	2,441
චන්කානෙයි	25	15	5,656
කෝපායි	31	27	14,260
පේදුරු තුඩුව	35	12	5,436
එකතුව			**138,373**

ඉහත වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් හා ඉලක්ක සම්පූර්ණ කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 දී ප්‍රගතිය
01	භූගත ජල මට්ටම් මිනුම් කිරීම හා දත්ත එකතු කිරීම (පාසල් අවසන් කල සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ සහාය ඇතිව සිදු කරනු ලැබේ.)	128%
02	භූගත ජල ප්‍රභවයන් නල ළිං සහ නොගැඹුරු වල ළිං පරීක්ෂා කර අදාල දත්තයන් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම	80%
03	වාර්තා සකස් කිරීම	75%
04	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	30%



රූපය 08: භූගත ජල නිමාන කටයුතු හා දත්ත එකතු කිරීම

2.2. යාන් ඔය වාරිමාර්ග ව්‍යාපාතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය (රු. මිලියන 0.20)

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ යාන් ඔය නව වාරිමාර්ග යෝජනා ක්‍රමයට සම්බන්ධ නොගැඹුරු ජලයේ ගුණාත්මකභාවයේ හා ප්‍රමාණයේ වෙනස්කම් හඳුනා ගැනීම වන අතර එය 2017 දී ආරම්භ කරන ලදී.

මෙම අධ්‍යයනය යටතේ 2021 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 දී ප්‍රගතිය
01	ජල නියැදී එකතු කිරීම (110), ජල මට්ටම මිනුම් කිරීම හා ස්ථානීය ජල නියැදි විශ්ලේෂණය (600)	44%
02	දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය	15%



රූපය 09: ජල නියැදී එකතු කිරීම සහ භූගත ජල මට්ටම් මිනුම් කිරීම - යාන් ඔය

2.3 මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය (රු. මිලියන 0.23)

මෙම අධ්‍යයනයේ මූලික අරමුණවනුයේ මල්වතු ඔය නව වාරිමාර්ග යෝජනා ක්‍රමයට සම්බන්ධ නොගැඹුරු ජලයේ ගුණාත්මකභාවයේ හා ප්‍රමාණයේ වෙනස්කම් හඳුනා ගැනීම වන අතර එය 2017 දී ආරම්භ කරන ලදි.

මෙම අධ්‍යයනය යටතේ 2021 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදි.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 දී ප්‍රගතිය
01	ජල නියැදී එකතු කිරීම (110) ජල මට්ටම මිනුම් කිරීම හා ස්ථානීය ජල නියැදි විශ්ලේෂණය (600)	41%
02	දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය	15%

(3) උත්පාදිත අරමුදල් ඉපැයීම සඳහා සිදු කරන ලද වාණිජ්‍ය ක්‍රියාකාරකම්

3.1 භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් - (රු. මිලියන 61.45)

පහත සඳහන් වානිජ ක්‍රියාකාරකම් මණ්ඩලය මඟින් 2021 වර්ෂයේ සිදුකොට ඇත. මෙම ක්‍රියාකාරකම් රජය, නොවන ආයතනය සහ ජනතාවගේ පෞද්ගලික ඉල්ලිම් මත මණ්ඩලය මඟින් ඇස්තමේන්තු කොට වාණිජ්‍ය මට්ටම්න් සිදු කරනු ලැබේ.

2021 වර්ෂයට අදාල ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
01	භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ	300	106%
02	නල ළිං ඉදිකිරීම	100	34%
03	පොම්ප පරීක්ෂණ	150	79%
04	නල ළිං පිරිසිදු කිරීම	05	40%
05	ජල සාම්පල විශ්ලේෂණය	400	84%

3.2. භූගත ජල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම - (රු. මිලියන 9.3)

2017 මාර්තු 16 දින නිකුත් කරන ලද 2010/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් භූගත ජලය භාවිතය නියාමනය කිරීමට අදාල ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇති වගකීම ඉටු කිරීමට 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකරකම් වල වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
01	බාහිර භූ ජල විද්‍යාඥයන් ලියාපදිංචි කිරීම	20	70%
02	පුද්ගලික විදුම් ආයතන ලියාපදිංචි කිරීම	140	70%
03	බාහිර භූ ජල සමීක්ෂණ වාර්තා අනුමත කිරීම	800	83%
04	Flow meters සවි කිරීම	20	25%

මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ද්‍රෝණි ආවරණය වන අතර එහිදී පර්යේෂණ නල ළිං150ක් සහ වර්ෂාපතන ස්ථාන 20ක් ස්ථාපිත කෙරේ. භූ ජල විද්‍යාත්මක තත්ත්වය, වර්තමානයේ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජලයේ ගුණාත්මකභාවය වෙනස්වීම සහ භූගත ජලය ක්ෂය වීමේ අවදානම සහිත ප්‍රදේශ මත පදනම්ව මෙම පර්යේෂණ නල ළිං ඉදිකිරීමේ ස්ථාන තෝරා ගැනීම සිදු කෙරේ. මෙම ස්වයංක්‍රීය පද්ධති මගින් නිරීක්ෂණය කරන භූගත ජලයේ මූලික ප්‍රමිතීන් ලෙස ජල මට්ටම, විද්‍යුත් සන්නායකතාවය, නයිට්‍රේට් සහ උෂ්ණත්වය හැඳින්විය හැකිය. තෝරාගත් ගංගා ද්‍රෝණි තුනේ භූගත ජලය දූෂණයේ කාලයත් සමඟ සිදුවන වෙනස්කම් අවබෝධ කර ගැනීම සඳහා භූගත ජලයේ බැර ලෝහ සාන්ද්‍රණය වරින් වර පරීක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘති කාර්යයන් සිදුකරන අතරතුර, පුත්තලම ප්‍රදේශය සහ යාපනය අර්ධද්වීපය ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ සඳහා එක්කරන ලද්දේ මෙම කලාප දෙකෙහි ද භූගත ජල සම්පත් නිරීක්ෂණය කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙනය. ඒ අනුව, ව්‍යාපෘතිය යටතේ ඉදිකරන පර්යේෂණ නල ළිං සංඛ්‍යාව පහත පරිදි සංශෝධනය කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 දී ප්‍රගතිය
01	මල්වතු ඔය	ගංගා ද්‍රෝණි 03 ආවරණය වන පරිදි පර්යේෂණ නල ළිං 150	85
02	කුඹුක්කන් ඔය		20
03	මාදුරු ඔය		20
04	පුත්තලම	ව්‍යාපෘතියට එක්කරන ලද ප්‍රදේශ	25
05	යාපනය අර්ධද්වීපය		40 (ජ.ස.ම. විසින් ඉදිකරන ලද දැනට පවතින ළිං සංවර්ධනය කර භාවිතා කෙරේ)
සම්පූර්ණ නිරීක්ෂණ ස්ථාන - 190 (යාපනයේ දැනට පවතින ළිං 40ක් එකතු කිරීමත් සමඟ)			

ජල සම්පත් මණ්ඩලය විසින් දැනටමත් ඉදිකර ඇති දැනට පවතින පර්යේෂණ නල ළිං යාපනය අර්ධද්වීපයේ ස්වයංක්‍රීය අධීක්ෂණ නල ළිං 40ක් ලෙස සංවර්ධනය කිරීමට යොදා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික භූගත ජල අධීක්ෂණ ජාලයක් පිහිටුවීමේ මූලික අදියර ලෙස (අ) භූගත ජල මට්ටම් (ආ) ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වඩාත් නිවැරදි තත්කාලීන දත්ත එක්රැස් කිරීම මෙහි මූලික අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය අවසානය වන විට පහත කාර්යයන් අවසන් කිරීමට නියමිතය

- භූගත ජලය සම්බන්ධ ගැටළු පුරෝකථනය කිරීම
- තෝරාගත් ගංගා ද්‍රෝණිවල භූගත ජලය ආශ්‍රිත ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබාදීම
- තෝරාගත් ගංගා ද්‍රෝණිවල තත්කාලීන භූගත ජල දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම
- දිවයින සඳහා නිසි භූගත ජල කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම
- තීරණ ගන්නන්, පර්යේෂකයන්, පාර්ශවකරුවන් සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා දත්ත සැපයීම



ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කගත ප්‍රතිලාභී කණ්ඩායම් වන්නේ භූගත ජලය මත යැපෙන ප්‍රධාන සහ කුඩා ග්‍රාමීය ජල යෝජනා ක්‍රම, ගෘහස්ථ පරිශීලකයින්, භූගත ජලය භාවිතා කරන වාණිජ ව්‍යවසායකයින්, කෘෂිකර්මාන්තය, කාර්මික, පතල් කැණීම්, සෞඛ්‍ය සේවා ආදියයි.

මධ්‍යගත දත්ත කළමනාකරණ මධ්‍යස්ථානය කොළඹ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවීමට නියමිතව ඇති අතර එහිදී දත්ත ලබා ගැනීම, සැකසීම, විශ්ලේෂණය සහ අර්ථ නිරූපණයන් සිදු කෙරේ. මෙම සීමිත ජල සම්පත් තිරසාර මට්ටමින් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පාර්ශවකරුවන් සහ ආයතන වෙත තාක්ෂණික නිර්දේශ සහිතව මෙම තොරතුරු අවශ්‍ය මාර්ගෝපදේශ සමඟින් ලබාදීමට සැලසුම් කර ඇත.

ව්‍යාපෘතියේ නියමු ප්‍රදේශ මීට අමතරව, භූගත ජල සම්පත් භාවිතා කිරීම සහ මිනිස් ක්‍රියාකාරකම් වලින් භූගත ජලය ආරක්ෂා කිරීම පිළිබඳ ජනතාවගේ හැසිරීම් වෙනස් කිරීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාව දැනුවත් කිරීම සිදු කෙරේ. මෙම නියමු ව්‍යාපෘතියේ මුළු පිරිවැය යුරෝ මිලියන 20.63ක් වන අතර නෙදර්ලන්තයේ රාබෝ

බැංකුව විසින් ණය මුදලක් ලෙස වීම මුදල සපයනු ලැබේ. ව්‍යාපෘති කටයුතු 2018 දී ආරම්භ කරන ලද අතර වය 2022 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය "Royal Eijkelcamp" කොන්ත්‍රාත්කරු විසින් Turn key ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන අතර වය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ජල සම්පත් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. දිවයිනේ භූජල විද්‍යාත්මක තත්ත්වය අනුව ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා දේශීය ව්‍යාපෘති කණ්ඩායම විසින් අධීක්ෂණය කරනු ලැබේ.





මල්වතු ඔය රඹෑව ප්‍රදේශයේ පර්යේෂණ නල ළිඳ කැණීම් සිදු කරන ආකාරය සහ
ලොගර් සවිකර ඇති ආකාරය

පර්යේෂණ නල ළිං ඉදිකිරීමේ ස්ථාන හඳුනාගැනීම සඳහා මූලික අධ්‍යයනය සහ දිගුකාලීන නිරීක්ෂණ අරමුණු සහිතව මෙම ගඟා ද්‍රෝණි තුන තුළ භූ භෞතික ගවේෂණ සිදු කර ඇත. මේ වන විට මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගඟා ද්‍රෝණි ආශ්‍රිතව ස්වයංක්‍රීය අධීක්ෂණය සඳහා පර්යේෂණ නල ළිං ඉදිකිරීම් සහ ලොගර් පද්ධති 125ක් නිම කර ඇත. පර්යේෂණ නල ළිං 08 ක් නිම කර ඇති පුත්තලම කලාපය තුළ නල ළිං ඉදිකිරීම කටුතු සිදුකරමින් පවතී. 2022 සැප්තැම්බර් වන විට පුත්තලම සහ යාපනය තුළ ස්වයංක්‍රීය පද්ධති සහ මධ්‍යගත දත්ත මධ්‍යස්ථාන ස්ථාපනය අවසන් කිරීමට නියමිතය. වෙබ් අඩවියට ස්වයංක්‍රීය දත්ත ලැබීමේ ක්‍රියාවලිය මේ වන විට බෝහෝ දුරට අවසන් කර ඇත.



නල ළිඳක් ඉදිකරන ලද ස්ථානයක පර්යේෂණ දත්ත වෙබ් අඩවියේ දැක්වෙන අයුරු

විදුම් අංශය

ප්‍රධාන කාර්යයන්

- නල ළිං ඉදිකිරීම.
- නල ළිං පිරිසිදු කිරීම.
- නල ළිං අත්පොම්ප සවි කිරීම.
- නල ළිං පුනරුත්තාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු
- පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා නල ළිං ඉදිකිරීමේ කටයුතු

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජල අවශ්‍යතාවය සඳහා විවිධ ප්‍රමාණ වල නල ළිං ඉදි කිරීම ප්‍රධාන කාර්ය භාරය වේ. විදුම් අංශය මඟින් නල ළිං විදුම් කටයුතු සිදු කරනු ලබන අතර ඒ සඳහා මෙහෙයුම් අංශය මඟින් ලබාදෙනු ලබන විදුම් කිරීම සඳහා ලබාදෙන අදාල නිර්දේශ අඩංගු ලිපිය මත සිදුකරනු ලබයි. (Job Order) ජල සම්පත් මණ්ඩලය සතුව ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සහ නිපුන විදුම් කණ්ඩායම් මෙන්ම ඒ සඳහා අවශ්‍ය කරන විදුම් යන්ත්‍ර සහ උපකරණ පවතී. මඩ විදුම් සහ වායු විදුම් යන දෙවර්ගයම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ඕනෑම භූ විද්‍යාත්මක ස්ථරයන් යටතේ නල ළිං ඉදි කිරීමේ හැකියාව පවතී.

සොනික් විදුම්

සොනික් විදුම් යනු නවීන විදුම් ක්‍රමවේදයකි. ඉහළ සංඛ්‍යාතයකින් හා චලනයන් සම්බන්ධ වී භ්‍රමනය සිදුවන විශේෂ විදුම් ක්‍රමයකි.

මෙම ක්‍රමය මඟින් පාංශු ස්ථර වල භූ විද්‍යාත්මක වශයෙන් විදුම් සඳහා යෙදෙන ද්‍රවන සහ අනෙකුත් ද්‍රව්‍ය මිශ්‍ර වීමකින් තොරව ලබා ගැනීමට ඇති හැකියාව පවතී.

මෙම විදුම් ක්‍රමය මඟින් නොබැදුනු පාංශු ස්ථරවල නියැදි මිශ්‍ර වීමෙන් තොරව අධ්‍යයනය කල හැකි වේ. නමුත් දැනට පවතින තාක්ෂණය අනුව සමහර අවස්ථාවලදී ගැඹුරු කලාපයන්ට යාමේ හැකියාවන් දැනට සීමාවී ඇත.

මෙම ක්‍රමය ජල සම්පත් මණ්ඩලය මඟින් මෑත කාලිනව ආරම්භ කරන ලද භූජල විමංශන අධ්‍යයන ව්‍යාපෘති මඟින් සිදු කරමින් පවතී.

දැනට මෙම අංශය සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය සතුව නල ළිං විදුම් පිළිබඳව මනා නුවණකින් යුතු නිපුන විදුම් නිලධාරීන් 9 යටතේ ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් කරන ලද විදුම් අංශයේ කාර්ය භාරයන් අනුව 2021 වර්ෂය සඳහා පහත කාර්ය භාරය සිදුකර ඇත.

2021 විදුම් අංශයේ වැඩ පිළිබඳ විස්තරය
විදුම් අංශයේ ප්‍රගතිය - 2021
නළ ළිං විදුම් කිරීම සහ ළිං පිරිසිදු කිරීම.

මාසය	වසිප් ව්‍යාපෘතිය	IGHP ව්‍යාපෘතිය	අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි	SICC ව්‍යාපෘතිය	වාණිජ ව්‍යාපෘතිය	ළිං පිරිසිදු කිරීම	එකතුව
ජනවාරි	1	_	_	_	2	_	**3**
පෙබරවාරි	2	1	_	_	3	_	**6**
මාර්තු	1	_	_	_	7	1	**9**
අප්‍රේල්	_	_	1	1	3	1	**6**
මැයි	1	_	_	_	1	_	**2**
ජූනි	_	_	_	_	1	_	**1**
ජූලි	1	_	_	_	4	3	**8**
අගෝස්තු	_	_	_	_	3	_	**3**
සැප්තැම්බර්	3	_	_	3	_	_	**6**
ඔක්තෝබර්	2	_	_	5	7	_	**14**
නොවැම්බර්	2	_	_	_	9	_	**11**
දෙසැම්බර්	1	_	_	_	13	1	**15**
එකතුව	**14**	**1**	**1**	**9**	**53**	**6**	**84**

ස්ථානභාර නිලධාරියාගේ නම	ඉදි කරන ලද නළ ළිං ප්‍රමාණය	ඉදි කරන ලද අත් පොම්ප ප්‍රමාණය	ඉදි කරන ලද බේසම් ප්‍රමාණය	පිරිසිදු කරන ලද ළිං ප්‍රමාණය	අලුත්වැඩියා කරන ලද අත් පොම්ප ප්‍රමාණය	ප්‍රතිසංස්කරණය කරන ලද ළිං
ඒ.එම්.සී.පී.බී අලහකෝන්	11	_	-	2	_	_
ජේ.පී.සී.සඳරුවන් මහතා	10	1	1	3	_	_
සී.බී.එස්.ගුණතිලක මහතා	7	_	_	_	_	_
කේ.විජිතරන් මහතා	5	_	_	_	_	_
ජේ.ජේ.එම්.පී.කේ. චන්ද්‍රසිරි මහතා	18	_	_	1	_	_
ජී.ජී.ඩී.නයනජිත් මහතා	19	_	_	_	_	_
පී.ඒ.ඇයි. බණ්ඩාර මහතා	8	_	_	_	_	_
එන්.ටී. කලුවල්ගොඩ මහතා	-	_	_	_	_	_
එකතුව	**78**	**_**	**_**	**6**	**_**	**_**

ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරවල 2021 වසරේ වාර්ෂික ප්‍රගතිය

2021 වසරේදී ජල සම්පත් මණ්ඩලයට අයත් රසායනාගාර 04 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)හි ජල සාම්පල විශ්ලේෂණය පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

	විශ්ලේෂණ වර්ගය	විශ්ලේෂණය කල ජල සාම්පල ගණන	ආදායම (රු.)
1	රසායනික විශ්ලේෂණ (සම්පූර්ණ විශ්ලේෂණ සහ ප්‍රමිතීන් කීපයක්) (වාණිජ)	436 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	**1,711,560.00**
2	ක්ෂුද්‍රජීව විශ්ලේෂණය (වාණිජ)	46 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	
3	රසායනික සහ ක්ෂුද්‍රජීව විශ්ලේෂණය (භාණ්ඩාගාර දීමනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති)	867 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	
4	බැර ලෝහ විශ්ලේෂණය (වාණිජ)	(කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	
5	සමස්ථ ආදායම	භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හැර	**1,711,560.00**

ජල විශ්ලේෂණය පිළිබඳ විස්තරය

1. රසායනික හා ක්ෂුද්‍රජීව විශ්ලේෂණය

   2021 වසරේදී වාණිජ ජල සාම්පල අටසිය හැට හතක් (සම්පූර්ණ, තෝරාගත් ජල පරාමිති සහ ක්ෂුද්‍රජීව) විශ්ලේෂණය කරන ලද අතර, ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාර හතරේ සමස්ත වාණිජ ආදායම මිලියන 1.7 විය.

2. රසායනාගාරවල තත්ත්ව සහතිකය පිළිබඳ විස්තරය (ISO 17025:2017)

   * ජල සම්පත් මණ්ඩලයේ කොළඹ රසායනාගාරයේ ජාත්‍යන්තර තත්ත්ව සහතිකය (ISO 17025:2017) ක්‍රියාත්මක කරමින් පවතින අතර අනුරාධපුර රසායනාගාරයේ එම සහතිකය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.





3. බැර ලෝහ පරීක්ෂාව (ආසනික්, කැඩ්මියම්, ක්‍රෝමියම්, ලෙඩ්, මැංගනීස්, සොඩියම්, පොටෑසියම්, සිනික්) බැර ලෝහ විශ්ලේෂණය සඳහා ව්‍යාපෘති සහ පුද්ගලික අංශ වලින් ජල සාම්පල ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාර වෙත ලැබේ.



රූපය 3: බැර ලෝහ විශ්ලේශණය කිරීමේ උපකරණය

2. ප්‍රගතිය:

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ISO 17025 : 2017 තත්ත්ව සහතිකය ශ්‍රී ලංකා ප්‍රතිතන ආයතනය (SRI LANKA ACCREDITATION BOARD)මගින් ජල සම්පත් මණ්ඩලයේ කොළඹ පිහිටි රසායනාගාරය වෙත පිරිනමා ඇත.

ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරයේ කාර්යභාර්යය වඩාත් ක්‍රමවත්ව, කාර්යක්ෂම ආකාරයෙන් පුළුල් කර රසායනික දත්ත වල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීම් සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතිකය රසායනික විශ්ලේෂණය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිතන ආයතනය මගින් 2016 ඔක්තෝම්බර් මස 12 වන දින ප්‍රදානය කරන ලදී. මෙම තත්ත්ව සහතිකය 2022 වසරේ ඔක්තෝම්බර් 11 වන දින දක්වා වලංගු වේ.

මුදල් අංශය

සමාලෝචිත වසර තුළදී මුලු ආදායම රුපියල් මිලියන 239.5 ක් විය. 2021 වර්ෂය වෙනුවෙන් පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් මහාභාණ්ඩාගාරයෙන් ලැබූ මුදල පිළිවෙලින් රුපියල් මිලියන 171.8 සහ රුපියල් මිලියන 8.173 කි. වර්ෂය සඳහා වාර්තාවූ අලාභය රුපියල් මිලියන 23.91.

පාලන අංශය

2021 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලයේ මුළු සේවක මණ්ඩලය 265 කි. කොන්ත්‍රාත් පදනම මත 01 සේවකයෙකු බඳවාගෙන ඇත. මෙම වසරේදී ස්ථිර සේවකයින් 24 දෙනෙකු බඳවා ගන්නා ලදී. සේවකයින් 04 දෙනෙකු ඉල්ලා අස්වී ඇති අතර, සේවකයින් 08 දෙනෙකු විශ්‍රාම ගොස් ඇත. සේවකයින් 03 දෙනෙකු මිය ගොස් ඇත.

මානව සම්පත් සංවර්ධනය

ජල සම්පත් මණ්ඩලයේ කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීම සඳහා සේවක මහත්ම මහත්මීන් පුහුණු සහ සංවර්ධන සඳහා යොමුකර ඇත. විධායක නිලධාරීන් ඇතුළුව සේවක මහත්ම මහත්මීන් 18 දෙනෙකු කෙටි කාලීණ පුහුණු වැඩසටහන් සඳහාත් සහතික පත්‍ර පාඨමාලා සඳහා සේවක මහත්ම මහත්මීන් දෙදෙනෙකු සහභාගී වී ඇත. වැඩමුළු සඳහා 1 අයෙකුද විදේශ සම්මන්ත්‍රණ සඳහා 1 අයෙකුද සහභාගීවී ඇත.

ප්‍රවාහන ඇනිය

සමාලෝචිත වසර තුළදී මණ්ඩලයේ ප්‍රවාහන ඇනිය වාහන හැත්තෑ තුනකින් (73) යුක්ත විය. මේවා අතරින් වාහන 63 ක් හොඳ තත්ත්වයේ පැවතිනි. ඒවා ප්‍රධාන වශයෙන් ද්විත්ව කාර්ය වාහන, මෝටර් රථ, ජීප්, ලොරි සහ බර ඔසවන යන්ත්‍ර වේ.

සංචාරක නිවාසය - අනුරාධපුරය

මණ්ඩලයේ නිලධාරී මහතුන්ගේ හා වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ රාජකාරී හා පුද්ගලික කටයුතු වලදී නවාතැන් ගැනීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ මහත්ම මහත්මීන්ට සිය සංචාරක කටයුතු වලදී නැවතී විවේක ලබා ගැනීම සඳහාත් මෙම සංචාරක නිවාසය ප්‍රයෝජනයට ගැනේ.

ස්තූතිය

මණ්ඩලයේ කාර්ය ඉටු කිරීමේදී ඊට විශේෂ අනුග්‍රහය දැක්වූ ගරු ජල සම්පාදන අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් එම අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන්ටද රජයේ වෙනත් දෙපාර්තමේන්තු රාජ්‍ය සේවා මණ්ඩල හා විදේශීය ආයතන වල විවිධ නිලධාරීන්ට හා උපදේශකයින්ට සිය ස්තූතිය සටහන්කොට තැබීම මණ්ඩලයට සතුටකි. ජල සම්පත් මණ්ඩලයට පක්ෂපාතීව සිය සේවාවන් ඉටු කිරීම ගැන ජල සම්පත් මණ්ඩලයේ සේවක මණ්ඩලයටද කෘතඥතාවය හිමිවේ.

ආචාර්ය ජේ.ඩී.සමරසිංහ
සභාපති
ජල සම්පත් මණ්ඩලය


මූල්‍ය ප්‍රකාශන

දෙසැම්බර් 31 දිනෙන් අවසන් 2021 වර්ෂය සඳහා	සටහන් අංක	නැවත ප්‍රකාශිත 2021 රු. 000	2020 රු. 000	2020 රු. 000	අයවැයගත 2021 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම්	01	53,597	77,554	75,934	76,538
භාණ්ඩාගාර ප්‍රතිපාදන - පුනරාවර්තන		171,800	181,500	181,500	174,000
භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන - (මෙහෙයුම්)	02	6,594	3.886	3,886	13,850
වෙනත් ආදායම්	03	7,562	5,088	5,088	4,650
මුළු ආදායම		**239,553**	**268,028**	**266,408**	**269,038**
පරිපාලන වියදම්	4.1	(192,276)	(203,907)	(203,907)	(193,800)
සැපයුම් සහ අවශ්‍යතා	4.2	(20,506)	(17,563)	(17,563)	(19,120)
කොන්ත්‍රාත් ගත සේවා හා නඩත්තු වියදම්	4.3	(27,185)	(28.653)	(28,653)	(27,760)
වෙනත් මෙහෙයුම් වියදම්	4.4	(6,658)	(6,732)	(6,732)	(6,838)
වෙනත් ව්‍යාපෘති වියදම්	4.5	(1,374)	(7,705)	(7,705)	(2,970)
භාණ්ඩාගාර ප්‍රතිපාදන (ප්‍රාග්ධන පර්යේෂණ අධ්‍යයනයන්)	4.6	(6,594)	(3,886)	(3,886)	(13,850)
ක්ෂයවීම්		(8,870)	(10,021)	(10,021)	(9,000)
මුළු වියදම්		**(263,463)**	**(278,467)**	**(278,467)**	**(273,338)**
මෙහෙයුම් වලින් අතිරික්තය (ඌණතාවය)		**(23,910)**	**(10,439)**	**(12,059)**	**(4,300)**
බදු		-	(534)	(534)	(500)
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය (ඌණතාවය)		**(23,910)**	**(10,973)**	**(12,593)**	**(4,800)**

ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන් අංක	2021 රු.000	නැවත ප්‍රකාශිත 2020 රු.000	2020 රු. 000
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	05	93,988	116,677	116,677
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	06	39,859	34,652	33,461
තොග	07	132,209	132,756	132,756
ඉදිරියට කල ගෙවීම්	08	4,496	97	97
		270,552	**284,182**	**282,991**
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	09	369,225	521,496	521,796
		369,225	521,496	521,796
මුළු වත්කම්		**639,777**	**805,678**	**804,787**
වගකීම්				
ජංගම වගකීම්				
වෙනත් වෙන්කිරීම් හා ගෙවිය යුතු දෑ	10	21,027	26,263	14,157
විලම්බිත ආදායම් (සේවා අත්තිකාරම්)	11	29,812	19,625	19,625
		50,839	45,888	33,782
ජංගම නොවන වගකීම්				
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	12	59,089	72,644	72,644
විලම්බිත ආදායම් (රජයේ ප්‍රදාන සඳහා)	13	334,244	478,574	478,529
		393,333	551,218	551,173
මුළු වගකීම්		**444,172**	**597,106**	**584,955**
ශුද්ධ වත්කම්		**195,605**	**208,572**	**219,832**
ශුද්ධ වත්කම් /ස්කන්ධය				
ප්‍රාග්ධන හා සංචිත				
සමුච්චිත අරමුදල	14	489,891	489,891	489,891
වෙනත් ප්‍රදාන	14	-	-	
සමුච්චිත ලාභ/ (අලාභ)	14	(313,786)	(300,819)	(289,559)
ප්‍රත්‍යාගණන සංචිතය	14	19,500	19,500	19,500
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**195,605**	**208,572**	**219,832**

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සමස්ත පරිපූරණය සඳහා අවශ්‍ය වන ගිණුම්කරණ ප්‍රමිතීන් හා සටහන් පිටු අංක 06 සිට 20 තෙක් ඇතුලත් වේ.

මණ්ඩලයේ පවත්නා වාර්තාවලට අනුව ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා නිවැරදි බවට මා විසින් සහතික කරමි.

අත්සන් කළේ. ඒ.බී.එම්. චන්ද්‍රසිරි
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න
වැඩ බලන සාමාන්‍යාධිකාරී

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකීම පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කලෙමි.

අත්සන් කළේ- ආචාර්ය ජේ.ඩී. සමරසිංහ
සභාපති
2022 පෙබරවාරි 15

ආර්. බී.සී. රත්නමලල
අධ්‍යක්ෂ මණ්ඩලය

ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට

සටහන් : 14

	සමුච්චිත අරමුදල	වෙනත් ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත ලාභ/අලාභ	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2020 වර්ෂය					
2019 දෙසැම්බර් 31 දිනට ඉ/ගෙ ශේෂය	**256,618**	**235,227**	**4,400**	**(274,549)**	**221,696**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	-	55	55
නැවත ප්‍රකාශිත ශේෂය	256,618	235,227	4,400	(274,494)	221,751
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	15,100	(12,593)	2,507
ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා කෙරිගෙන යන වැඩ		(1,954)	-	-	(1,954)
වෙනත් ප්‍රදාන සමුච්චිත අරමුදලට මාරු කිරීම	233,273	(233,273)	-	-	-
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මතවූ ලාභය/අලාභය	-	-	-	(2,472)	(2,472)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**-**	**19,500**	**(289,559)**	**219,832**
2020 වර්ෂය (නැවත ප්‍රකාශිත)					
2020 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය	**256,618**	**235,227**	**4,400**	**(274,549)**	**221,696**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්				(12,825)	(12,825)
නැවත ප්‍රකාෂිත ශේෂය	256,618	235,227	4,400	(287,374)	208,871
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)			15,100	(10,973)	4,127
ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා කෙරිගෙන යන වැඩ මාරු කිරීම		(1,954)	-	-	(1,954)
වෙනත් ප්‍රදාන සමුච්චිත අරමුදලට මාරු කිරීම්	233,273	(233,273)		-	-
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත වූ ලාභය/(අලාභය)				(2,472)	(2,472)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**-**	**19,500**	**(300,819)**	**208,572**
2021 වර්ෂය					
2020 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය	**489,891**	**-**	**19,500**	**(300,819)**	**208,572**
පෙර කාල පරිච්ඡෙද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්				-	-
නැවත ප්‍රකාෂිත ශේෂය	489,891	-	19,500	(300,819)	208,572
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)				(23,910)	(23,910)
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත වූ ලාභය/(අලාභය)				10,943	10,943
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**-**	**19,500**	**(313,786)**	**195,605**

සටහන -

සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 1295 මගින් (780 වැනි රැස්වීම - 16 දෙසැම්බර් 2020) වෙනත් ප්‍රදාන සමුච්චිත අරමුදල හා ඒකාබද්ධ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාර ප්‍රතිපාදන (පුනරාවර්ථන) වලට පෙර වර්ෂයේ ලාභය/(අලාභය)	(195,710)	(191,939)	(193,559)
එකතු කළා භාණ්ඩාගාර ප්‍රතිපාදන - (ප්‍රත්‍යාවර්ථන) ලැබීම්	171,800	181,500	181,500
වර්ෂය සඳහා බදු පෙර ලාභය / (අලාභය)	**(23,910)**	**(10,439)**	**(12,059)**
කෙරිගෙන යන වැඩ ගැලපීම්	-	207	207
අඩුකලා - පෙර වසරේ ගැලපීම්	(864)	-	-
	(24,774)	**(10,232)**	**(11,852)**
මූල්‍ය නොවන සංචලනයන්			
ක්ෂයවීම්	8,870	10,021	10,021
පාරිතෝෂිත වෙන් කිරීම වැඩි කිරීම්	9,942	12,915	12,915
ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම)	4,673	5,697	5,697
වෙනත් ජංගමවත්කම් වැඩිවීම / (අඩුවීම)	(3,852)	10,457	10,457
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය / (පාඩුව)	(20)	(791)	(791)
ලැබිය යුතු දෑ වැඩි වීම / (අඩුවීම)	(5,190)	4,615	6,235
	(10,351)	**32,682**	**32,682**
පාරිතෝෂිත ඉතිරිකිරීම් වලින් ලද පොලි ලැබීම්	(3,178)	(3,637)	(3,637)
බදු ගෙවීම	-	-	-
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(13,529)**	**29,045**	**29,045**
ආයෝජන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල	-	867	867
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	(2,489)	(3,306)	(3,306)
පාරිතෝෂිත ඉතිරි කිරීම් වලින් ලද පොලිය	3,178	3,637	3,637
පාරිතෝෂිත ගෙවීම්	(11,428)	(16,024)	(16,024)
ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(10,739)**	**(14,826)**	**(14,826)**
මූල්‍යන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රදාන (දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනය)	1,579	2,664	2,664
මූල්‍යන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,579**	**2,664**	**2,664**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**(22,689)**	**16,883**	**16,883**
වර්ෂයේ මුල මුදල් හා මුදල් සමාන දෑ	**116,677**	**99,794**	**99,794**
වර්ෂයේ අග මුදල් හා මුදල් සමාන දෑ	**93,988**	**116,677**	**116,677**

◆ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

01 මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් හා බැංකු වල පවත්නා ශේෂයන්ගෙනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි අඩංගු වන මුදල් හා මුදල් සමාන දෑ සඳහා ඇතුලත්ව ඇති මූල්‍ය තත්ව ප්‍රමාණය පහත දැක්වේ.

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
බැංකු වල ඇති ජංගම ගිණුම් ශේෂයන්	**82,575**	**96,583**	**96,583**
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීම්	**11,413**	**20,094**	**20,094**
	93,988	**116,677**	**116,677**

02 මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන (ප්‍රාග්ධන) වලින් වූ මුදල් ප්‍රවාහය අන්තර්ගත වී ඇත්තේ මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය තුළයි

හෙලිදරව් කිරීමේ ප්‍රකාශය

	මුදා හැරීම් (රු.000')	භාණ්ඩාගාර මුද්‍රණ පිටපතට අනුව (රු.000')	වර්ෂය සඳහා වෙන් කිරීම් (රු.000')
01 පුනරාවර්ථන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක : 166-01-02-4-1503			
මූල්‍ය කාර්යය සාධනය	171,800	171,800	190,000
	171,800	**171,800**	**190,000**
02 ප්‍රාග්ධන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක : 166-01-02-4-2201			
මූල්‍ය කාර්යය සාධනය - මෙහෙයුම්	6,594	20,000	20,000
මූල්‍ය තත්වය වෙනස් වීමේ ප්‍රකාශනය (වත්කම් මිලදී ගැනීම සඳහා)	1,579	-	-
	8,173	**20,000**	**20,000**

1. සංස්ථාපිත තොරතුරු

සාමාන්‍ය

ජල සම්පත් මණ්ඩලය 1964 අංක 29 දරණ පනතේ විධිවිධාන යටතේ 1966 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

ප්‍රධාන ක්‍රියාකාරම් සහ මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුලදී මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වලට භූ ජල සමීක්ෂණ සිදු කිරීම, නළ ළිං ඉදි කිරීම, ජල නියැදිවල රසායනික විශ්ලේෂණය, නළ ළිං පිරිසිදු කිරීම සහ භූගත ජල සිතියම් සැකසීම ආදිය ඇතුලත් විය.

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ.

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යාලයේ ලිපිනය

නො. 288/12වීල්, රෝයල් ගාර්ඩින්ස්, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

2. වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව හා මුදල් අමාත්‍යාංශයේද එකඟතාවය මත නිකුත් කරන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. (යොමුව : 2013.10.02 දිනැති අංක PED/03/2013 දරණ චක්‍රලේඛණය)

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04,05,13,16,17,18 හා 20 යන ගිණුම්කරණ ප්‍රමිත වර්තමානයේදී මණ්ඩලයට අදාල නොවේ.

2.2. සකස් කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය මණ්ඩලයේ කටයුතු කරන මුදල් වර්ගය වන අතර සියලු මූල්‍ය තොරතුරු විශේෂයෙන් සඳහන් කර නොමැති නම් හැරෙන්නට ආසන්න දහස් ගණනට ඉදිරිපත් කර ඇත.

3. වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

3.1 දේපළ , පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මුල් වරට පිරිවැයට ගණන් ගෙන ඇති අතර සමුච්චිත ක්ෂය අඩුකල අගය වාර්තා කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු මිලදීගැනීම් / ප්‍රත්‍යාගණන අගය හෝ ඉදිකිරීම සඳහා වැය වන වියදම හා බැදුණු මූලික වියදම් ද සමඟ වේ.

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අගය අනුව ඉදිරියට ගෙනයනු ලබන අතර පසුකාලීන ක්ෂයවීම් අඩුකරනු ලැබේ.

ගොඩනැගිලි - බදු පදනම මත ඉඩම්

වසර 30ක බදු පදනම මත ලබාගත් ඉඩම් වල ප්‍රදාන ලෙස හෝ ස්වකීය අරමුදල් භාවිතා කර ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි/ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර ඇත.

3.2 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් නිදහස් ඉඩම් මූලික අගය කිරීම සඳහා ප්‍රත්‍යාගණනය ක්‍රමය යොදාගනු ලබයි. අනෙකුත් වත්කම්, ශුද්ධ වත්කම් අගය බින්දුව හෝ සාධාරණ අගය හා රැගෙනයාමේ අගය අතර සාධනීය වෙනසක් පවතින විට ප්‍රත්‍යාගණනය කරනු ලබයි. වත්කම් බැහැර කරන විට වත්කමට අදාල ප්‍රත්‍යාගණනය සංචිතය රඳවාගත් ලාභයට මාරු කරනු ලබයි.

3.3 ක්ෂයවීම්

වත්කම් භාවිතයට ගැනීම සූදානම් වන අවස්ථාවේදී ක්ෂය කරනු ලබන අතර භාවිතයෙන් ඉවත් කරන වත්කම් එසේ හඳුනාගන්නා දිනයේදී ක්ෂයවීම් නතර කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ඒවායේ පිරිවැය/ප්‍රත්‍ය ගණන අගය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමයටයි. මෙම අරමුණ ඇතිව යොදා ගනු ලබන ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාත මෙසේය.

ගොඩනැගිලි	5%
මෝටර් වාහන	25%
යන්ත්‍රෝපකරණ	20%
රසායනාගාර උපකරණ	20%
විද්‍යාත්මක උපකරණ	20%
පරිෂණක සහ උපාංග	20%
ගෘහභාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ	10%

3.4 රජයේ ප්‍රදාන

භාණ්ඩාගාරයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් අදාල රාජ්‍ය, ව්‍යාපෘති වලින් ලබා ගන්නා ලද වත්කම් ආදායම් ප්‍රවේශය යටතේ හඳුනාගනු ලැබේ. වත්කම් වල ජීවිත කාලය අනුව ක්‍රමානුකූල පදනමක් මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුල ක්ෂය කිරීමේ හිණුමට හිලව් වන පරිදි විලම්බිත ආදායම (රජයේ ප්‍රදාන වලට සම්බන්ධ) කපාහැරේ.

3.5 ඉතිරි තොග

වාහන අමතර කොටස්, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ අමතර කොටස්, ඉන්ධන සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය, යනාදියෙන් ඉතිරි තොග සමන්විතවේ. තොග පිරිවැය සමන්විත වන්නේ පළමුව ලබාගත් තොග පළමුව නිකුත්කිරීමේ (FIFO) පදනම මතය.

3.6 ලැබිය යුතු දෑ

3.6.1 උපලබ්ධි විය හැකි බවට ඇස්තමේන්තුගත කරන ලද ප්‍රමාණයන්ගෙන් ලැබිය යුතු දෑ ප්‍රකාශ වේ.

3.6.2 බොල්ණය හා අඩමාණ ණය

මෙම ණය සඳහා ඇස්තමේන්තු කල අලාභ පදනම් වී ඇත්තේ සියලු ඉන්වොයිසි වල සහ ගෙවීම් පිළිබඳ සිදුකල අබණ්ඩ ඇගයීම් ක්‍රමය පදනම් කරගෙනය.

4. ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ පිරිවැයට ඉදිරිපත් කෙරේ.

4.1 විලම්බිත ආදායම

සේවා ලබා ගැනීම සඳහා ලද අත්තිකාරම්, ආදායම් ලෙස හඳුනාගන්නා තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ කලින් ලද ආදායම් ලෙස දැක්වේ.

4.2 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්ථමානයේ පවත්නා බැඳීම් (නෛතික හෝ සම්මුතික) වෙනුවෙන් විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කල හැකි වීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. වියදම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රතිපාදනයන් ප්‍රතිපූර්ණය කිරීම මූල්‍ය කාර්ය සාධනයෙන් ඉදිරිපත් කෙරේ.

5. ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ ජල සම්පත් මණ්ඩලයට ගලා එනු ලැබීමේ හැකියාව ඇති වීම සහ ඒවා විශ්වාසනීය ලෙස මැනිය හැකි වීම මත මිස ගෙවීම් සිදුකල විට නොවේ.

ප්‍රධාන ආදායම් මාර්ග

භූ විද්‍යාත්මක සමීක්ෂණ, නළ ළිං ඉදිකිරීම, අත් පොම්ප සවි කිරීම, පොම්ප පරීක්ෂණ, නළ ළිං පිරිසිදු කිරීම, නළ ළිං විශ්ලේෂණය සහ ජලයේ අඩංගු යකඩ නිශ්සාරණ පෙරණ සවිකිරීම ආදියෙන් වන අතර අදාල කාර්යයන් ඉටු කිරීමෙන් පසු ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

වෙනත් ආදායම්

සංචාරක බංගලා වෙන්කිරීම්, දඩ, අධිභාර, යෝග්‍යතා සහතික ආදායම් හා විවිධ ආදායම් වලින් වෙනත් ආදායම් සමන්විත වන අතර ඒවා උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොලී ආදායම්

පොලී ආදායම් මූලික වශයෙන් ආපදා ණය සඳහා පොළිය, පාරිතෝෂික ගෙවීම් සඳහා ඉතිරි කිරීම් වල පොළිය හා බැංකුවේ තැන්පතු සඳහා පොළිය යනාදියෙන් සමන්විත වේ.

6 විශ්‍රාමික පාරිතෝෂික බැදීම

6.1 පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව ජල සම්පත් මණ්ඩලය විසින් පාරිතෝෂික ගෙවීම් සිදු කල යුතුව ඇත. මේ සඳහා වූ වගකීම මූල්‍ය ප්‍රකාශන තුල අර්ථ ගැන්වූ ප්‍රතිලාභ සැලැස්ම ලෙස පාරිතෝෂික වගකීමේ වර්ථමාන අගය සේවකයන් අනුව වාර්තා කරන දිනට හඳුනාගනු ලබයි.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත ඔස්සේ අනුමත කර ඇති පරිදි අර්ථ ගැන්වූ ප්‍රතිලාභ වගකීම, සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු වන Actuarial& Management Consultants (Pvt) Ltd විසින් වාර්තා කරන දිනට පුරෝකථන ඒකක ක්‍රමය මඟින් ගණනය කරනු ලබයි. මෙම ආයුගණක තක්සේරු කිරීම සෑම වර්ෂයකම ක්‍රියාත්මක කරනු ලබයි. සේවකයා සේවයට බැදුණු දින සිට මෙම පාරිතෝෂික වගකීම හටගනී.

ජල සම්පත් මණ්ඩලය විසින් පාරිතෝෂික වගකීම ආයුගණක තක්සේරු ක්‍රමයට අනුකූලව පාරිතෝෂික වගකීමෙහි වර්ථමාන අගය මනිනු ලබයි. රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 19 සේවක ප්‍රතිලාභ 01.01.2018 දින සිට බල පැවැත්වේ.

සැලසුම් වත්කම්

බාහිර වශයෙන් මූල්‍ය සපයා නොමැති වගකීමකි. ජල සම්පත් මණ්ඩලය විසින් වෙනමම ජාතික ඉතිරි කිරීමේ ගිණුමක් මෙම පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබයි.

6.2 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් දායක සැලසුම

සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදලේ දායක මුදල් අදාල ප්‍රඥප්ති සහ රෙගුලාසි වලට අනුකූල වන සේවකයන් සුදුසුකම් ලබයි. සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදල් සඳහා මණ්ඩලයේ දායකත්වය පිළිවෙලින් 12% ක සහ 3% ක් වේ.

7. බදුකරණය

බදු වියදම, ප්‍රවර්තන සහ පෙර වර්ෂ සඳහා වන ගැලපීම් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් වලින් සමන්විත වේ.

8. පර්යේෂණ අධ්‍යයන වියදම

භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන වැය ශීර්ෂ යටතේ පර්යේෂණ අධ්‍යයන සඳහා සෘජුව හඳුනාගෙන ඇති මෙහෙයුම් පිරිවැය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

9. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. මෙහෙයුම් කටයුතු වලින්, ආයෝජන කටයුතු වලින් හා මූල්‍ය කටයුතු වලින් ලද දළ මුදල් ගලාඒම් සහ ලැබීම් හා ගෙවීම් භාවිතයන් එහි හඳුනාගෙන ඇති අතර මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් බැංකුවේ පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ.

10. වාර්තාකරන දිනෙන් පසු සිදුවීම

වාර්තා කරන දිනෙන් පසු හඳුනාගනු ලබන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අදාල පරිදි මූල්‍ය ප්‍රකාශන වල ගැලපිම් කිරීමත් අනාවරණය කිරීමත් කරනු ලැබේ.

11. විදේශ මූල්‍ය ව්‍යාපෘති .

භූගත ජල කළමනාකරණ පද්ධති පිහිටුවීම. මල්වතු ඔය, මාදුරු ඔය හා කුඹුක්කන් ඔය ගං ඉවුරු සඳහා මූලික ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මල්වතු ඔය, මාදුරු ඔය, හා කුඹුක්කන් ඔය ගං ඉවුරු ආවරණය කරමින් පාලන ස්ථාන 150ක් හා දිය ඇළි ස්ථාන 20 ක් පිහිටුවීමක් සිදු කරනු ලබයි. ජල මට්ටම, විදුලි ක්‍රියාත්මක බට, නයිට්‍රේට් සහ උෂ්ණත්වය යන මූලික පරාමිති යනාදිය මෙම ස්වයංකිය පද්ධතිය මඟින් පාලනය කරනු ලබයි. මෙයට අමතරව භූගත ජලයේ බර ලෝහ සාන්ද්‍රණය කාලීනව ඇගයීම සිදු කරනු ලබයි.

මල්වතු ඔය, මාදුරු ඔය හා කුඹුක්කන් ඔය ඉවුරු ව්‍යාතපෘතිය මඟින් ආවරණය වන අතර අළුතින් පුත්තලම හා යාපනය අර්ධද්වීපය තුල මෙහෙයුම් ස්ථාන වැඩිකිරීම මඟින් ස්ථාන 190 ක් දක්වා

වැඩිකිරීමට කටයුතු කරන ලදී.

මෙහි මූලික අරමුණ වනුයේ මූලික පියවරක් ලෙස ජාතික භූගත ජල කළමනාකරණ පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ජලයේ ගුණාත්මකභාවය හා භූගත ජල මට්ටම් පිළිබඳ සැබෑ දත්ත ලබා ගැනීමයි. මධ්‍යගත තොරතුරු කළමනාකරණ පද්ධතියක් කොළඹ ස්ථාපිත කිරීමට නියමිතය. ඊට අමතරව භූගත ජල සම්පත භාවිතය හා ආරක්ෂාව පිළිබඳ සමාජ ආකල්ප වෙනස් කිරීම් සඳහා දැනුවත් කිරීම් සිදුකරනු ලබයි.

මෙම මූලික ව්‍යාපෘතියේ මුළු පිරිවැය වන යුරෝ මිලියන 20.63 අරමුදල Rabo බැංකුව, නෙදර්ලන්තය මඟින් සහනදායී ණය මුදලක් ලෙස සපයනු ලබයි.

2018 වර්ෂය තුළදී මූලික පියවර ආරම්භ කරන ලද අතර 2022 සැප්තැම්බර් වන විට අවසන් කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය නැවත භාරදීමේ ව්‍යා පෘතියක් ලෙස කොන්ත්‍රාත්කරුවන නෙදර්ලන්තයේ “Royal Eijkeicamp” විසින් වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ජල සම්පත් මණ්ඩලය විසින් කරනලද ව්‍යාපෘති යෝජනාවකට අනුව සිදුකරනු ලබයි.

ව්‍යාපෘතියේ කාර්තුව සඳහා වන ක්‍රියාකාරකම් සැලසුම සාර්ථක ලෙස නිම කිරීම් සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් නිර්දේශ කරනු ලබයි. විභව පාලන ස්ථාන හඳුනාගැනීම ගං ඉවුරු තුනක් තුල සම්පූර්ණ කර ඇත. වර්තමානයේ මල්වතු ඔය හා අනෙක් ගං ඉවුරු වල කැප කරන ලද පාලන ළිං ඉදි කිරීම බොහෝ දුරට සම්පූර්ණ කර ඇත. කුඹුක්කන් ඔය ඉවුරු විදුම් කටයුතු සිදුකරමින් පවතී. ස්වයංක්‍රීය සංවේදක පද්ධති 21 ක් දැනටමත් සම්පූර්ණ කර ඇත. ඉතිරි පාලන පද්ධති හා මධ්‍යගත දත්ත මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම 2022 මැද භාගයේ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

මල්වතු ඔය , මාදුරු ඔය හා කුඹුක්කන් ඔය ඉවුරු වල ඉදි කරන ලද නල ළිං වර්තමානය වන විට සම්පූර්ණ කර ඇත.

එයට අමතරව පුත්තලම ප්‍රදේශයේද ළිං කැණීම් ද සිදු කරමින් පවතී.

යාපනය අර්ධද්වීපයේ දැනටමත් ජල සම්පත් මණ්ඩලය විසින් ඉදි කරන ලද නළ ළිං 40 ක ප්‍රමාණයද මෙම ස්වයංක්‍රීය සංවේදක පද්ධතියට ඇතුළත් කිරීම සඳහා වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

ස්වයංක්‍රීය සංවේදක පද්ධති 121 මල්වතු ඔය, මාදුරු ඔය හා කුඹුක්කන් ඔය ඉවුරු සම්පූර්ණ කර ඇත.

ඉතිරි පාලන පද්ධති හා මධ්‍යගත දත්ත මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම 2022 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම

	නැවත ප්‍රකාශිත		අයවැයගත
	2021	2020	2020	2021
සටහන් අංක : 01	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**
භූ ජල සමීක්ෂණ /භූගත ජල ගවේෂණය				
භූ ජල සමීක්ෂණ	13,958	17,969	17,519	12,000
නල ළිං ඉදිකිරීම	15,831	28,042	28,042	32,000
ජල ධාරිතා පරීක්ෂණ	12,277	12,381	12,381	16,000
නල ළිං පිරිසිදු කිරීම	198	859	859	250
ජල නියැදි විශ්ලේෂණය	1,712	2,923	1,753	1,200
උප එකතුව	**43,976**	**62,174**	**60,554**	**61,450**
භූගත ජල නියාමනයන් ක්‍රියාත්මක කිරීම.				
විදුම් යන්ත්‍ර ලියාපදිංචිය	5,560	5,607	5,607	7,600
බාහිර භූ විද්‍යාඥ ලියාපදිංචිය	455	415	415	500
භූජල විද්‍යා වාර්තා ආදායම	684	233	233	800
ජල මාපක ස්ථාපිත කිරීමේ ආදායම	54	111	111	400
උප එකතුව	**6,753**	**6,366**	**6,366**	**9,300**
භූජල සංවර්ධනය				
භූජල අධ්‍යයනය - යාපනය අර්ධද්වීපය	1,235	2,442	2,442	2,340
භූජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	58	369	369	230
භූජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	66	397	397	200
මල්වතු ඔය ගං ඉවුරේ භූගත ජල කළමනාකරණය	1,509	1,450	1,450	3,018
වේගවත් කල සංවර්ධන වැඩසටහන - නළ ළිං	-	3,461	3,461	-
රසායනාගාර පුහුණු මධ්‍යස්ථානය අනුරාධපුර	-	895	895	-
උප එකතුව	**2,868**	**9,014**	**9,014**	**5,788**
මුළු එකතුව	**53,597**	**77,554**	**75,934**	**76,538**
සටහන් අංක : 02				
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන				
(පර්යේෂණ අධ්‍යයනයන් - මෙහෙයුම්)				
සංවේදී භූවිෂමතා පිළිබඳ වූ භූ ජල අධීක්ෂණය	3,000	1,178	1,178	3,000
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳව අධ්‍යයනය	1,093	249	249	2,000
භූජල සම්පත් හායනය හා දූෂණය පිළිබඳ පරීක්ෂාව	236	204	204	1,500
විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම	1,191	832	832	1,150
ස්වාභාවික උල්පත් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය - මාඔය	355	-	-	2,500
පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සඳහා මුදාහැරීම	579	1,186	1,186	2,700
කාර්යය මණ්ඩල පුහුණුව	140	237	237	1,000
මුළු එකතුව	**6,594**	**3,886**	**3,886**	**13,850**
සටහන් අංක : 03				
වෙනත් ආදායම්				
සංචාරක නිවාස ආදායම	68	90	90	50
දඩ මුදල් හා අධිභාර	3,322	4	4	200
වත්කම් අපහරණය කිරීමේ ආදායම	21	791	791	500
ණය හා බැංකු තැන්පතු මත පොළී ආදායම	3,178	3,637	3,637	2,600
සේවක නේවාසික කුළී ආදායම	90	141	141	100
වාහන සේවා ආදායම	-	-	-	200
විවිධ ආදායම්	883	425	425	1,000
මුළු එකතුව	**7,562**	**5,088**	**5,088**	**4,650**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	නැවත ප්‍රකාශිත		අයවැයගත	
	2021	2020	2020	2021
	රු.000	රු.000	රු.000	රු.000
සටහන් අංක : 4.1				
පරිපාලන වියදම්				
වැටුප් හා වේතන	148,170	153,034	153,034	150,000
සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම (12%+3%)	19,970	21,026	21,026	20,000
සේවක ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය (පාරිතෝෂිත)	9,942	12,916	12,916	10,000
අතිකාල හා නිවාඩු දින වැටුප්	9,468	11,686	11,686	8,000
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	205	213	213	300
වෙනත් දීමනා	145	106	106	150
ගමන් වියදම් - දේශීය	2,709	2,857	2,857	3,300
ගමන් වියදම් (දීමනා) - විදේශීය	-	-	-	50
සුභසාධක වියදම් හා ක්‍රීඩා පහසුකම්	231	243	243	300
වෛද්‍යාධාර ගෙවීම්	712	744	744	900
සංග්‍රහ කිරීම්	558	750	750	650
විවේක නිවාඩු සඳහා ගෙවීම්	166	332	332	150
මුළු එකතුව	**192,276**	**203,907**	**203,907**	**193,800**
සටහන් අංක : 4.2				
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය				
ඉන්ධන හා ලිහිසි තෙල්	13,307	12,934	12,934	11,200
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	6,408	2,221	2,221	6,500
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය හා වෙනත්	697	2,194	2,194	1,250
වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය	94	214	214	170
මුළු එකතුව	**20,506**	**17,563**	**17,563**	**19,120**
සටහන් අංක: 4.3				
ගිවිසුම්ගත සේවාවන් හා නඩත්තු වියදම්				
තැපැල් හා දුරකථන	1,757	1,855	1,855	1,500
විදුලිය	2,477	3,094	3,094	3,000
ගෙවල් කුලී, ගොඩනැගිලි කුලී හා බදු	9,369	4,230	4,230	10,000
වරිපනම් හා බදු	634	861	861	900
මාර්ගස්ථ මුදල් රක්ෂණය	12	12	12	10
විගණන ගාස්තු	504	471	471	400
මුද්‍රණ	364	312	312	600
වැඩමුළු හා සම්මන්ත්‍රණ	77	46	46	50
ජල බිල්පත්	332	262	262	300
නවාතැන් පහසුකම්	238	625	625	500
උපදේශක ගාස්තු	613	668	668	500
විවිධ වියදම්	1,206	732	732	700
මෝටර් වාහන නඩත්තු වියදම්	2,911	4,658	4,658	3,000
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	3,157	6,822	6,822	2,800
කාර්යාල උපකරණ නඩත්තු වියදම්	2,095	2,820	2,820	2,000
ගොඩනැගිලි නඩත්තුව වියදම්	1,439	1,185	1,185	1,500
මුළු එකතුව	**27,185**	**28,653**	**28,653**	**27,760**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	නැවත ප්‍රකාශිත		අයවැයගත	
	2021	2020	2020	2021
	රු.000	රු.000	රු.000	රු.000
සටහන් අංක : 4.4				
වෙනත් මෙහෙයුම් වියදම්				
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	708	604	604	400
නිල ඇඳුම්	368	388	388	200
වාර ප්‍රකාශන හා පුවත්පත්	47	64	64	100
ප්‍රචාරණය	670	775	775	700
බැංකු ගාස්තු	118	123	123	130
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු	207	150	150	250
නීති වියදම්	67	20	20	50
මුද්දර බදු	75	76	76	100
වාහන සේවා කිරීම - රත්මලාන	74	176	176	500
කුලී ගාස්තු	5	64	64	80
දඩ හා අධිභාර	43	16	16	48
මෙහෙයුම් කල්බදු වාරික	4,276	4,276	4,276	4,280
මුළු එකතුව	**6,658**	**6,732**	**6,732**	**6,838**
සටහන් අංක: 4.5				
වෙනත් ව්‍යාපෘති වියදම්				
භූජල අධ්‍යයනය - යාපනය අර්ධද්වීපය	1,235	2,442	2,442	2,340
භූජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	58	369	369	230
භූජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	66	397	397	200
භූජල කළමනාකරණය - මල්වතු ඔය ඉවුර	15	141	141	200
නල ළිං ඉදිකිරීම - අධි වේගවත් කල සංවර්ධන වැඩසටහන්	-	3,461	3,461	-
අධි වේගවත් සංවර්ධන වැඩසටහන් - නළ ළිං	-	895	895	-
මුළු එකතුව	**1,374**	**7,705**	**7,705**	**2,970**
සටහන් අංක : 4.6				
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන				
(පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම්)				
සංවේදී භූ විෂමතා පිළිබඳ වූ භූ ජල සමීක්ෂණය	3,000	1,178	1,178	3,000
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම අධ්‍යනය	1,093	249	249	2,000
භූජල සම්පත් හායනය හා දූෂණය පිළිබඳ පරීක්ෂාව	236	204	204	1,500
විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම්	1,191	832	832	1,150
ස්වාභාවික උල්පත් පිළිබඳ පර්යේෂණ අධ්‍යනය - මාඔය	355	-	-	2,500
පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීම් සඳහා මුදාහැරීම්	579	1,186	1,186	2,700
කාර්යය මණ්ඩල පුහුණුව	140	237	237	1,000
මුළු එකතුව	**6,594**	**3,886**	**3,886**	**13,850**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
සටහන් අංක :05			
මුදල් හා මුදල් සමාන දෑ			
(1) ලංකා බැංකුව යෝක් වීදිය ශාඛාව (0002026295)	5,028	591	591
(2) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323267)	76,390	94,905	94,905
(3) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323268)	615	11	11
(4) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0005342839)	542	1,076	1,076
උප එකතුව	**82,575**	**96,583**	**96,583**
සේවක ප්‍රතිලාභ - වත්කම් සැලැස්ම			
(5) ජාතික ඉතිරි කිරීමේ බැංකුව බම්බලපිටිය ශාඛාව (100230211818)	11,413	20,094	20,094
මුළු එකතුව	**93,988**	**116,677**	**116,677**

සටහන - අරමුදල් කළමණාකරන ගිණුම

ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාවේ දැනට පවතින අංක 0002323267 දරණ ජංගම ගිණුම හා ඒකාබද්ධව අංක 83141035 දරණ අරමුදල් කළමනාකරණ ගිණුමක්, ජංගම ගිණුමේ පවතින මුදල් ශේෂය සඳහා පොලියක් ඉපයීමේ අරමුණින් 2018.09.07 දින ආරම්භ කරන ලදි. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක - 1203)

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
සටහන් අංක :06			
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ			
සේවක			
(01) ආපදා ණය	22,410	20,859	20,859
(02) උත්සව අත්තිකාරම්	30	20	20
උප එකතුව	**22,440**	**20,879**	**20,879**
වෙනත්			
(03) වෙළඳ	10,462	7,214	6,683
(04) සැපයුම් අත්තිකාරම්	189	33	33
(05) ලැබිය යුතු රඳවා ගැනීම්	3,846	3,418	3,915
(06) ලැබිය යුතු වීකතු කල අගය මත බදු (ආපසු ගෙවීම්)	1,263	1,263	1,263
(07) වෙනත් ලැබිය යුතු දෑ	1,659	1,727	1,727
(08) තොග ඌනතා	-	118	118
උප එකතුව	**17,419**	**13,773**	**13,739**
ලැබිය යුතු දෑ මුළු එකතුව	**39,859**	**34,652**	**34,618**
(09) අඩු කළා : ගෙවිය යුතු වීකතු කල අගය මත බදු	-	-	(1,157)
මුළු එකතුව	**39,859**	**34,652**	**33,461**

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000

සටහන් අංක : 07

තොග

ද්‍රව්‍ය හා අමතර කොටස්			
වාහන අමතර කොටස්	2,435	2,504	2,504
වාහන අමතර කොටස්(වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	1,992	2,037	2,037
ඉන්ධන හා ලිහිසි තෙල්	1,681	1,304	1,304
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	26,538	25,825	25,825
ගොඩනැගිලි ද්‍රව්‍ය	723	908	908
ලිපිද්‍රව්‍ය	367	440	440
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (2 කේ. ආර් අමතර කොටස්)	56,211	56,662	56,662
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	37,110	38,464	38,464
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (අමාත්‍යාංශ)	2,411	2,415	2,415
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය	2,741	2,197	2,197
එකතුව	**132,209**	**132,756**	**132,756**

සටහන් අංක : 08

ඉදිරියට කල ගෙවීම්			
මුද්දර ගාස්තු	24	88	88
මාර්ගස්ථ මුදල්	9	9	9
වෙනත්	4,463	-	-
එකතුව	**4,496**	**97**	**97**

දේපළ, පිරියත උපකරණ

සටහන් අංක : 09

පිරිවැය	**01.01.2021 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**ඉවත් කිරීම් / ගැලපීම්**	**31.12.2021 දිනට ශේෂය**
	රු. 000	**රු. 000**	**රු. 000**	**රු. 000**
ඉඩම්	1,897	-	-	1,897
ගොඩනැගිලි	12,779	37,811	-	50,590
මෝටර් වාහන	130,500	-	-	130,500
යන්ත්‍රෝපකරණ	485,207	1,004	-	486,211
රසායනාගාර උපකරණ	122,807	-	(32,536)	90,271
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	27,287	811	(1)	28,097
පරිගණක හා උපාංග	11,461	16	-	11,477
විද්‍යාත්මක උපකරණ	87,430	570	-	88,000
ගොඩනැගිලි (කෙරිගෙන යන වැඩ)	1,384	114	(300)	1,198
මුළු එකතුව	**880,752**	**40,326**	**(32,837)**	**888,241**

ක්ෂය කිරීම්	01.01.2021 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	අපහරණය / ගැලපීම්	31.12.2021 දිනට ශේෂය
	රු.000	රු.000	රු.000	රු.000
ගොඩනැගිලි	1,253	639	-	1,892
මෝටර් වාහන	-	32,603	-	32,603
යන්ත්‍රෝපකරණ	255,047	97,126	-	352,173
රසායනාගාර උපකරණ	41,463	19,612	(11,949)	49,126
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	4,140	2,751	-	6,891
පරිගණක හා උපාංග	6,779	1,704	-	8,483
විද්‍යාත්මක උපකරණ	50,274	17,574	-	67,848
මුළු එකතුව	**358,956**	**172,009**	**(11,949)**	**519,016**
ශුද්ධ පොත් අගය	**521,796**			**369,225**

දේපළ, පිරියත උපකරණ සඳහා වූ සටහන්
සටහන් අංක : 09

01 මූල්‍ය කාර්ය සාධනයෙහි ඇතුලත් ක්ෂයවීම් පහත සඳහන් පරිදි සිදුකර ඇත.

ක්ෂය කිරීම්	වර්ෂය සඳහා අයකිරීම්	වර්ෂය සඳහා විලම්භිත ආදායම	අනාවරණය කරන ලද
	රු.000	රු.000	රු.000
ගොඩනැගිලි	639	326	313
මෝටර් වාහන	32,603	28,830	3,773
යන්ත්‍රෝපකරණ	97,126	96,950	176
රසායනාගාර උපකරණ	19,612	19,509	103
ලීබඩු,සවිකිරීම් හා කාර්යාල උපකරණ	2,751	1,255	1,496
පරිඝණක හා උපාංග	1,704	546	1,158
විද්‍යාත්මක උපකරණ	17,574	15,723	1,851
එකතුව	**172,009**	**163,139**	**8,870**

02 වාර්ෂික බදු කුලී ගෙවීමේ පදනම මත බදු ගිවිසුමක් කොරකහවැව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩමට ඇත. (හෙක්ටයාර් 2.166)

03 වර්ෂ 30 ක කාලයක් සඳහා නාමික කුලී ගෙවීම් පදනම මත බත්තරමුල්ලේ පිහිටි පර්චස් 40.0 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇත.

04 සංචාරක නිවාසය-අනුරාධපුර ඉඩම (හෙක්ටර් 0.0759) 1982 අංක දරණ ගැසට් නිවේදනය මඟින් අවුරුදු 30 ක කල්බදු ගිවිසුමකට 26.08.2016 පවරා දෙන ලදී. වාර්ෂික තක්සේරු නිවේදනය නොපැවතීම හේතුවෙන් වෙන්කිරීම් සිදුකර නැත.

05 ජල සම්පත් මණ්ඩලය විසින් භාවිතය සිදු කරන නමුත් නීතිමය අයිතිය නොමැති ඉඩම් හා ගොඩනැගිලි විස්තර 31.12.2021 දිනට පහත පරිදි වේ.

ඉඩම	ගොඩනැගිලි (ආසන්න)
රත්මලාන වැඩබිම	1.79378 හෙක්ටයාර
වව්නියාව වැඩබිම	0.1050 හෙක්ටයාර

06 වර්ෂය තුල වත්කම් මිලදී ගැනීම් /වත්කම් ප්‍රදාන/ප්‍රත්‍යාගණන ශුද්ධ අගය/සාධාරණ අගය ගැලපීම් සටහන් වකතුකිරීම් ලෙස සටහන් අංක 09 හි වකතුකිරීම් යටතේ දක්වා ඇත.

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
සටහන් අංක : 10			
වෙනත් වෙන් කිරීම් හා ගෙවිය යුතු දෑ			
(1) විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	450	732	732
(2) උපචිත වියදම් (කරුණාකර පිටු අංක 21 බලන්න)	9,339	9,428	9,428
(3) වෙනත් ගෙවිය යුතු දෑ	11,238	16,063	3,957
(4) රඳවාගත් මුදල්	-	40	40
උප එකතුව	**21,027**	**26,263**	**14,157**

සටහන් අංක 11

විලම්බිත ආදායම			
ජල මාපක අත්තිකාරම්	-	677	677
සේවා අත්තිකාරම්	29,773	18,897	18,897
සමීක්ෂණ වාර්තා අත්තිකාරම්	39	51	51
මුළු එකතුව	**29,812**	**19,625**	**19,625**

		නැවත ප්‍රකාශිත	
	2021	2020	2020
	රු.000	රු.000	රු.000
සටහන් : 12			
සේවක ප්‍රතිලාභ			
12.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්			
වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පහත සඳහන් පරිදි දායක මුදල් ගෙවීම් සිදු කර ඇත.			
සේවක අර්ථසාධක අරමුදල			
සේවකගේ දායකත්වය - 12%	15,976	16,821	16,821
සේවකයාගේ දායකත්වය - 10%	13,313	14,018	14,018
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - 3%	3,994	4,205	4,205
12.2 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්			
වර්ෂය ආරම්භය දැනට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීම්	72,644	73,281	73,281
කාලපරිච්ඡේදය සඳහා පොලී පිරිවැය	5,812	7,694	7,694
ප්‍රවර්ථන සේවා පිරිවැය	4,130	5,221	5,221
ආයුගණක ලාභ/(අලාභ)	(10,943)	2,472	2,472
වර්ෂය තුල ප්‍රතිලාභ ගෙවීම්	(11,428)	(16,024)	(16,024)
ගෙවිය යුතු ප්‍රතිලාභ	(1,126)	-	-
	59,089	**72,644**	**72,644**

12.2.1 වර්ෂය තුළ ආදායම් ප්‍රකාශනයට හඳුනාගත් වියදම්

ප්‍රවර්ථන සේවා පිරිවැය	4,130	5,221	5,221
කාලපරිච්ඡේදය සඳහා පොළී පිරිවැය	5,812	7,694	7,694
	9,942	**12,915**	**12,915**
හිමිකම් ප්‍රකාශය (පිටු අංක 3 බලන්න)			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වූ ආයුගණක ලාභ/(අලාභ)	**10,943**	**(8,471)**	**(2,472)**

12.2.2. වෘත්තීය ජීවගත තක්සේරු සමාගමක් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමේ පුපාලනාදන් මහතා විසින් 2021.12.31 දිනට පරිතෝෂික වගකීම සඳහා තක්සේරුවක් සිදු කරන ලදී.

ජීවගත තක්සේරු කරු විසින් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීමේදී පහත උපකල්පන සහ දත්ත භාවිතා කරන ලදී.

	2021	**2020**
වට්ටම් අනුපාතය	11.5%	8.0%
වැටුප් වර්ධක අනුපාතය	9.5%	7.0%
සේවක පිරිවැටුම් අනුපාතය	3.0%	8.0%

12.2.3 පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම

අනාගත ආයුකාලය සඳහා වූ උපලේඛන සැලකිල්ලට ගැනීමේදී ලන්ඩන් හි තක්සේරුකාර ආයතනය විසින් නිකුත් කරන ලද අංක A/1967/70 දරණ වගු චක්‍රය අදාල කරගෙන ඇත

මෙහිදී පුද්ගල විශ්‍රාම වයස අවුරු 62 ක් ලෙස හා අවුරුදු 62 සම්පූර්ණ වන උපන් දිනය සාමාන්‍ය විශ්‍රාමික වයස ලෙස උපකල්පණය කෙරේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව සේවකයෙකුට පාරිතෝෂික සඳහා වන වගකීම පැන නගින්නේ අඛණ්ඩ සේවයෙන් වසර 5 ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

12.2.4 සංවේදීතා විශ්ලේෂණය

අනෙක් සියලු උපකල්පන නොවෙනස්ව පවතින විට විචල්‍යයන් 1% කින් වෙනස්වීම සේවක ප්‍රතිලාභ කෙරෙහි වන බලපෑම පහතින් දැක්වේ.

	2021		
	වැඩිවීම් + 1 % රු.000		**අඩුවීම් - 1 % රු.000**
වට්ටම් අනුපාතය	54,354		64,562
වැටුප් වර්ධක අනුපාතය	63,775		54,970

		නැවත ප්‍රකාශිත	
	2021	**2020**	**2020**
	රු.000	**රු.000**	**රු.000**
සටහන් අංක :13			
විලම්භිත ආදායම් (විස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර පිටු අංක 20 බලන්න)	**334,244**	**478,574**	**478,529**

සටහන් අංක :14

ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සඳහා කරුණාකර පිටු අංක 3 බලන්න.

සටහන 13

විලම්බිත ආදායම

විස්තරය	01.01.2021 දිනට ශේෂය	වර්ෂය තුල එකතුකිරීම්	වර්ෂය සඳහා අය කිරීම්		31.12.2021 දිනට ශේෂය
			ක්ෂය වීම් රු	ප්‍රත්‍යාගනන ගැලපීම්/ ඉවත් කිරීම්	
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ඉඩම්	-	-	-	-	-
ගොඩනැගිලි	6,521	37,812	(326)	-	44,007
මෝටර් වාහන	115,400	-	(28,830)	-	86,570
යන්ත්‍ර උපකරණ	229,562	920	(96,950)	-	133,532
රසායණාගාර උපකරන	81,024	-	(19,509)	(20,586)	40,929
ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ	11,051	-	(1,255)	-	9,796
පරිඝණක හා උපාංග	1,569	-	(546)	-	1,023
විද්‍යාත්මක උපකරණ	33,447	549	(15,723)	-	18,273
ගොඩනැගිලි (කෙරීගෙන යන වැඩ)	-	114	-	-	114
මුළු එකතුව	**478,574**	**39,395**	**(163,139)**	**(20,586)**	**334,244**

දේපල පිරියත උපකරණ සඳහා වූ සාධරණ අගයෙහි බලපෑම

විස්තරය	2020 වර්ෂය	2018 වර්ෂය	2017 වර්ෂය	2016 වර්ෂය	
		අතිරික්තය	ඌනතාවය	අතිරික්තය	ඌනතාවය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
මෝටර් වාහන	15,100	-	-	916	-
යන්ත්‍ර උපකරණ	-	-	-	-	5,317
රසායණාගාර උපකරණ	-	-	-	-	631
ලී බඩු සවි කිරීම්	-	3,228	-	-	-
පරිගණක හා උපාංග	-	-	-	256	-
විද්‍යාත්මක උපකරණ	-	-	242	-	-
මුළු එකතුව	15,100	3,228	242	1,172	5,948
බලපෑම	මූල්‍ය තත්වය	මූල්‍ය තත්වය	ආදායම් ප්‍රකාශනය	මූල්‍ය තත්වය	ආදායම් ප්‍රකාශනය


විගණකාධිපති
වාර්තාව

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

2022 ජූලි 11 දින

FINANCE DIVISION
20 JUL 2022
අයිඩබ්ලිව්ආර්බී WRB

සභාපති

ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන් සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-

01. ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඩබ්ආර්/ඒ/ඩබ්ආර්බීඒ/එෆ්ඒ/2021 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූලි 11 දින

සභාපති,

ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජල සම්පත් මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස්තිබූ හෙක්ටර් කොඩිබැකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකොට තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී මණ්ඩලය විසින් අවුරුදු 45 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය සහ ඉඩමෙන්, නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු කිරීමකින් තොරව ඉවත්වී ප්‍රධාන කාර්යාලය 2021 ජූලි 18 දින සිට කුළි ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබුණි. එසේ වුවත් මෙමගින් මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවලට සිදුවූ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙලිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන

සමහ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මා නිගමණය කරොත් නම්, එම කරුණු මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ . මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත්

විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (අ) නියෝග අංක 01	කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ගත යුතු වුවත් මෙතෙක් එකී කිසිදු වගා ලිදක් සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) නියෝග අංක 02

(i) නළ ලිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 67 පමණක් ලියාපදිංචි වී තිබුණි. එසේම ලියාපදිංචි නොවී සිටින ආයතන මොනාවාද යන්නා හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ආයතනය විසින් ගෙන නොතිබුණි.

(ii) ඉහත ලියාපදිංචි ආයතනය විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු ගැඹුරු හෝ නොගැඹුරු නළ ලිංහි දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ජලය වෙත ලබා දිය යුතු වුවත් මෙතෙක් ලියාපදිංචි වූ ආයතන 67 අතරින් කිසිදු ආයතනයක් ඉහත වාර්තාව ඉදිරිපත් කොට නොතිබුණි.

(ඇ) නියෝග අංක 03

(i) ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක්

සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 40 ක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණ ද කිසිදු ආයතනයක් ඉහත වාර්තා මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි.

(ii) වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූ ගත ජලය ලබා ගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගත යුතු වේ. එහි විධිවිධාන ප්‍රකාරව කිසිදු ආයතනයක් අදාළ තත්ව වාර්තාව ලබා ගෙන නොතිබුණි.

(ඇ) නියෝග අංක 05

ස්වභාවික ජල උල්පතක් හෝ භූ ගත ජලය උපයෝගී කර ගනිමින් නිශ්පාදන හා සේවා කටයුතු සිදු කරනු ලබන ආයතන හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානයන් වලට ඇතුලු වී පරීක්ෂා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයතෙක් ලියාපදිංචි වී තිබූ පානීය ජල බෝතල් කිරීමේ කර්මාන්ත ශාලා 40 ක කිසිදු ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට නොතිබුණි.

(ඉ) නියෝග අංක 06

ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයන් හෝ රාජ්‍ය නොවන සංවිධානයන් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන සහ සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

නොරොච්චෝල ප්‍රදේශයේ පිහිටා ඇති ලක් විජය බලාගාරය අවට ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති නළ ලිං හි ජල සාම්පල් 50 ක් පරීක්ෂා කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් භාර ගෙන තිබුණද අනුරාධපුර රසායනාගාරයෙහි කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කළ අවධියේ පටන් පැවති විදුලි පද්ධතියේ බිඳ වැටීම් හේතුවෙන් සහ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි රසායනාගාරයෙහි ස්ථාපිත කොට ඇති බැර ලෝහ විශ්ලේෂණ යන්ත්‍රය (shimaza AA- 6300) 2018 වර්ෂයේ සිට අක්‍රියව පැවතීම හේතුවෙන් එම කාර්යය බාහිර ආයතනයකින් කරවා ගැනීමට රු.3,831,300 ක වටිනාකමක් ගෙවා තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් තමන් සතු සම්පත් නිසි පරිදි අලුත්වැඩියා කර උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.3,831,300 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට අහිමි වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සේවා අත්තිකාරම් ගිණුමේ පැවති ශේෂයෙන්, රු.5,382,771 ක් වර්ෂයකට වඩා පැරණි අත්තිකාරම් ශේෂයක් විය. ඉන් රු.3,553,471 ක් මණ්ඩලය විසින් ඊට අදාළ කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් නැවත ගෙවීමට සිදු වී තිබුණි. තවද නළ ලිං ඉදි කිරීම අසාර්ථක වීම හේතුවෙන් රු.1,597,000 ක මුදල් නැවත ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි. මණ්ඩලය විසින් කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදය හා සිදුකරනු ලබන කාර්යයන්ගේ සඵලදායිතාව නොමැති වීම හේතුවෙන් රු.5,150,471 ක ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ජල සම්පත් මණ්ඩලයෙහි අනුරාධපුර රසායනාගාරය වෙත පරීක්ෂණ කටයුතු සඳහා යොමු කරන ලද ජල සාම්පල් 360 කින් නිමකර තිබුනේ 28 ක් පමණි. තව දුරටත් පරීක්ෂණ 332 ක් සිදුකළ යුතුව තිබූ බැවින් කාර්යසාධනය ඉතා පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඉන්දියානු අධාර නිවාස ව්‍යාපෘතිය මගින් නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්කයන්හි වතු නිවාස ආශ්‍රිතව නළ ලිං 6 ක් ඉදි කිරීම සඳහා රු.6,095,000 ක මුදලක් 2020 වර්ෂයේදී මණ්ඩලය වෙත ගෙවා තිබුණි. ඉදිකරන ලද නල ලිං 03 ක් අසාර්ථක වීම හේතුවෙන් ඊට අදාල මුදල් වූ රු. 2,883,000 ක් නැවත ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව මණ්ඩලයට පාඩුවක් සිදු වී තිබුණු අතර නල ලිං ඉදිකිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කළ මණ්ඩලයේ භූ ජල විද්‍යාඥයන් එසේ කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) අනුරාධපුර පලාත් කාර්යාලයේ ස්ථාපිත කරන ලද රසායනාගාරය වෙත සපයා තිබූ භූගත ජලයේ පවතින කෘෂි රසායනයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගන්නා රු.32,535,430 ක් වටිනා GC MS -MS යන උපකරණය සැපයූ දින සිට අක්‍රිය තත්ත්වයේ පැවතියද එකී උපකරණය සැපයුම්කාර සමාගම විසින් ලබා දී තිබූ වර්ෂයක වගකීම් කාලය (2018.08.09 සිට 2019.08.08) තුළ එය අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ජලයේ පවතින කෘෂි රසායන සංයුතිය විශ්ලේෂණය කළ හැකි වෙනත් කිසිදු උපකරණයක් ජල සම්පත් මණ්ඩලය සතුව නොතිබියදී එම උපකරණය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරනු වෙනුවට එය භාවිතයට ගැනීමට නොහැකි ලෙස සලකා වෙනත් ව්‍යාපෘතියකට ලබාදීමට සභාපතිවරයා කටයුතු කර තිබීම විගණනයේදී ගැටළුසහගත තත්ත්වයක් විය.

(උ) ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට සඳහා 2021 ජූලි 12 දින අමාත්‍ය මණ්ඩලය නියෝග කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන තෙක් අදාල කෙටුම්පත නීතිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. පනත සංශෝධනය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා පනත සංශෝධනය කිරීමේ අරමුණ ලෙස හඳුනාගෙන ඇති වැරදි සහ ඊට අදාල දඩුවම් පැමිණිවීමේදී පැන නගින ගැටලු සහ භූගත ජලය අවභාවිතා කිරීම හා අසීමාන්තික ලෙස උකහා ගැනීමේ ගැටලු සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඌ) ජල සම්පත් මණ්ඩලය සතුව විදුම් යන්ත්‍ර 16 ක් පැවති අතර ඉන් 03 අක්‍රිය තත්වයේ පැවතීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට අපහරණය කිරීමට සැලසුම් කොට තිබුණද මෙතෙක් අපහරණය කොට නොතිබුණි. විදුම් යන්ත්‍ර 05 ක් අලුත් වැඩියා කලයුතු තත්වයේ පැවතියද මෙතෙක් අදාල කටයුතු අවසන් කොට නොතිබුණි. සමාලෝචිත

වර්ෂය තුල විදුම් යන්ත්‍ර 08ක් පමණක් සේවයේ යොදවා තිබුණි. 2021 වර්ෂයේ නළ ළිං 80 ක් පමණක් ඉදි කර තිබූ අතර ඒ අනුව විදුම් අංශයේ කාර්ය සාධනය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(එ) ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කලමණාකරණය කිරීම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සකස් කරන ලද ව්‍යාපෘති යොජනාවක් පදනම් කොට ගෙන, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා 2015 ජුලි මස 10 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රථමයෙන් වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නෙදර්ලන්තයේ රෝයල් අයිකල් කැම්ප් (Eijkelkamp Earth Sampling Group) ආයතනය වෙත යුරෝ 20,629,921 පිරිවැයක් මත පිරිනැමීම සඳහා 2017 ඔක්තෝම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතිය යටතේ යුරෝ 2,240,030 ක් හෙවත් රුපියල් මිලියන 393.976 ක්වූ විදුම් යන්ත්‍ර 02 ක් ව්‍යාපෘතිය අවසන්යේ පසු මණ්ඩලයට පවරාදීමට නියමිතව තිබුණද එම යන්ත්‍ර ක්‍රියාකරවීමට අවශ්‍ය පුහුණුව ලබාදී නොතිබුණි. ව්‍යාපෘතිය යටතේ යුරෝ 1,033,928 ක් වැයකර ඉදිකිරීමට යෝජිත දත්ත මධ්‍යස්ථානය වර්ෂ 04 ක් ගතවී තිබුණද ඉදිකර නොතිබුණි. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව ගොඩනැගිල්ල ඉදිනොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකිවී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2.2.2 නීතිරීති / විධානයට යොමුව			
	(අ)	අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය **නියෝග අංක 01** කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩ් කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ගත යුතු වුවත් මෙතෙක් එකී කිසිදු වගා ලිදක් සඳහා මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. **නියෝග අංක 02** i.නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 67 පමණක් ලියාපදිංචි වී තිබුණි. එසේම ලියාපදිංචි නොවී සිටින ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ආයතනය විසින් ගෙන නොතිබුණි. ii. ඉහත ලියාපදිංචි ආයතනය විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු ගැඹුරු හෝ නොගැඹුරු නළ ළිංහි දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් මෙතෙක් ලියාපදිංචි වූ ආයතන 67 අතරින් කිසිදු ආයතනයක් ඉහත වාර්තාව ඉදිරිපත් කොට නොතිබුණි. **නියෝග අංක 03** i. ජලය බෝතල් කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේනම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 40 ක් මණ්ඩලයේ ලියාපදිංචි වී	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** 2010/23 සහ 2017.03.16 දිනැති ගැසට් පත්‍රයට අනුව භූගත ජල නියාමන කටයුතු විධිමත් කර පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් අංශ වැඩිදියුණු කිරීමට කටයුතු යොදා ඇත. රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකරන අවස්ථා වලදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ජල සම්පත් මණ්ඩල පණතෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ජල සම්පත් මණ්ඩල පණත සංශෝධනය කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව පණත සංශෝධනය කිරීම සඳහා වන කැබිනට් අනුමැතිය ලැබී ඇත. පණතෙහි සංශෝධන කෙටුම්පත්මේ වන විට අවසන් කර ඇති අතර පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රී කණ්ඩායම දැනුවත් කිරීමට කටයුතු යොදා ඇත. ඉන් අනතුරුව මෙම කෙටුම්පත් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අදාල සංශෝධන සිදුකර නිති රෙගුලාසි ක්‍රියාත්මක කර නියාමන ක්‍රමවේදය විධිමත් කිරීමට බලාපොරොත්තු වේ. භූ ගත ජල නියාමන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ජල සම්පත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් හා ලංකාවම ආවරණය වන පරිදි අදාල නියාමන කටයුතු සිදු කිරීම සඳහා නව තනතුරු ඇති කරන ලද අතර එම බඳවා ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අනුමැතිය සඳහා ඉල්ලීම් සිදු කර අදාල කටයුතු සිදු කරමින් පවතී. කොවිඩ් 19 වසංගත තත්වයෙන් පසු රට තුල ඇති වූ ආර්ථික තත්වයන් සැලකිල්ලට ගෙන නියාමන ක්‍රමවේදය විධිමත් කිරීමේ අරමුණින් වාණිජ අරමුණු වෙනුවෙන් ජලය උකහා ගනු ලබන ආයතනයන්හි තොරතුරු එක් රැස් කර අදාල කටයුතු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී. අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති අත්‍යවශ්‍ය තනතුරු යම් ප්‍රමාණයකට

		බඳවා ගනු ලැබූ අතර පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ රටට සිදුවී ඇති බලපෑම මත තිබුණ ද කිසිදු ආයතනයක් ඉහත වාර්තා මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි. ii. වානිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගත යුතු වේ. එහි විධිවිධාන ප්‍රකාරව කිසිදු ආයතනයක් අදාළ තත්ත්ව වාර්තාව ලබා ගෙන නොතිබුණි. **නියෝග අංක 05** ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කර ගනිමින් නිශ්පාදන හා සේවා කටයුතු සිදු කරනු ලබන ආයතන හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානයන් වලට ඇතුලු වී පරීක්ෂා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයතෙක් ලියාපදිංචිවී තිබූ පානීය ජල බෝතල් කිරීමේ කර්මාන්ත ශාලා 40 ක කිසිදු ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට නොතිබුණි. **නියෝග අංක 06** ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයන් හෝ රාජ්‍ය නොවන සංවිධානයන් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන සහ සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	බඳවා ගනු ලැබූ අතර පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ රටට සිදුවී ඇති බලපෑම මත පුරප්පාඩු පිරවීම සම්පූර්ණ ලෙස සිදු කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවද දැනට සිටින කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය සහිතවහූ ගත ජල සම්පත් කළමණාකරනයට අදාලව රාජ්‍ය වගකීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. දැනට පවතින රාජ්‍ය යාන්ත්‍රණය සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම්, ජල සම්පාදන මණ්ඩලය, ප්‍රජා ජල දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධීකරණයෙන් භූගත ජල මූලාශ්‍ර වල තොරතුරු රැස් කර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, ඒ අනුව දැනට එම දත්ත ජල සම්පත් මණ්ඩලය වෙත ලැබෙමින් පවති. මෙම තොරතුරු තවදුරටත් විධිමත්ව ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා විසින්ද දිස්ත්‍රික්ක ලේකම්තුමන්ලා වෙත අදාල කාර්යයෙහි වැදගත්කම සඳහන් කරමින් නැවත දැනුවත් කිරීමක් සිදු කරන ලද අතර එම තොරතුරු ක්‍රමවත්ව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙහිදී රටේ පවතින වර්තමාන තත්වය හමුවේ මෙම කාර්යයන් හැකි ඉක්මනින් අවසන් කර ගැනීමට යම් අපහසුතාවන් පවති. කෙසේ වෙතත් පවතින දුෂ්කරතා හමුවේ වුවද මෙම දත්ත විශ්ලේෂණය කර වගා ලිං, වාණිජමය, කෘෂිකාර්මික, කර්මාන්ත අවශ්‍යතා සඳහා භාවිතා කරන නල ලිං හඳුනා ගැනීමට කටයුතු කරන අතර, ඒ අනුව නියාමන කටයුතු තවදුරටත් විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු සිදු කරමින් පවති.
2.2.4		නොරොච්චෝල ප්‍රදේශයේ පිහිටා ඇති ලක් විජය බලාගාරය අවට ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති නළ ලිං හි ජල සාම්පල් 50 ක් පරීක්ෂා කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් භාර ගෙන තිබුණි. එසේ වුවද මණ්ඩලය සතු අනුරාධපුර රසායනාගාරයෙහි කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කළ අවධියේ පටන් පැවති විදුලි පද්ධතියේ බිඳ වැටීම් හේතුවෙන් එකී ජල පරීක්ෂණවලට අදාළ බැර ලෝහ විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. එම කාර්යය බාහිර ආයතනයන් වෙතින් සිදු කරවා ගැනීමට 2021 මාර්තු 30 දින පැවති අංශ ප්‍රධාන රැස්වීමේදී තීරණය කොට තිබුණි. ඒ අනුව රු.3,831,300 ක වටිනාකමක් ගෙවා කාර්මික	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** AAS උපකරණය කලක් භාවිතා කළ උපකරණයක් වන අතර ICP-MS උපකරණය නවීන අධි තාක්ෂණ,පරාමිති (Cd, Pb, Mn, Mg, Ca, Na, K etc.) කිහිපයක් එකවර කඩිනමින් විශ්ලේෂණය කර ගත හැකි සංවේදී උපකරණයකි. අදාල ව්‍යාපෘතියේ අවශ්‍යතාවය වුයේ විශ්ලේෂණ කටයුතු වැඩි නිරවද්‍යතාවය නවීන උපකරණයක් මගින් සිදු කිරීම වූ බැවින් 2021.03.30 දින පැවති අංශ ප්‍රධාන රැස්වීමේදී මෙම විශ්ලේෂණ කටයුතු ITI ආයතනයට ලබා දීමට තීරණය කරන ලදී.

		තාක්ෂණ ආයතනය (ITI) වෙතින් ඉටු කර ගැනීමට මණ්ඩලය කටයුතු කොට තිබුණි. ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ප්‍රදේශයේ පිහිටි රසායනාගාරයෙහි ස්ථාපිත කොට ඇති බැර ලෝහ විශ්ලේෂණ යන්ත්‍රය (shimaza AA-6300) 2018 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පවතින අතර සමාලෝචිත වර්ෂය තෙක් එය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් තමන් සතු සම්පත් නිසි පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.3,831,300 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට අහිමි වී තිබුණි.	
2.3	**වෙනත් කරුණු**		
	(අ)	සේවා අත්තිකාරම් ගිණුමේ පැවති ශේෂයෙන්, රු. 5,382,771 ක වටිනාකමක් වර්ෂයකට වඩා පැරණි අත්තිකාරම් ශේෂයක් විය. ඉන් රු.3,553,471 ක් මණ්ඩලය විසින් ඊට අදාළ කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් නැවත ගෙවීමට සිදු වී තිබුණි. තවද නළ ලිං ඉදි කිරීම අසාර්ථක වීම හේතුවෙන් රු. 1,597,000 ක මුදල් නැවත ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි. මණ්ඩලය විසින් කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදය හා සිදුකරනු ලබන කාර්යයන්ගේ සඵලදායිතාව නොමැති වීම හේතුවෙන් රු.5,150,471 ක ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** 2021 වසරේ පැවති රටේ පැවති කොවිඩ් වසංගතය නිසා නිලධාරීන්/සේවකයින්ගේ පැමිණීම ඉතාමත් අඩු මට්ටමක පැවතුනි. එම නිසා ආයතනයේ දෛනික කටයුතු ඉටුකරගැනීමේදී බොහෝ අපහසුතාවලට මුහුණ දීමට සිදු විය. මේ හේතුව නිසා අදාල කාල වකවානුව තුල පළාත් කාර්යාල සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ඉතාමත්ම අඩු මට්ටමක පැවතුනි. එබැවින් 2021 වර්ෂයේ විවිධ ස්ථාන වල සේවා කටයුතු සිදු කිරීම යම් තාක් දුරට ප්‍රමාද විය. ජල සම්පත් මණ්ඩලයේ භූ ජල විද්‍යාඥයන් භූ විද්‍යාත්මක උපකරණ භාවිතාකොට විවිධ ප්‍රදේශයන්වල සේවාවක් ලෙස භූජල සම්ක්ෂණ සිදුකරනු ලබයි. නමුත් ඇතැම් ප්‍රදේශවල පවතින භූජල විද්‍යාත්මක ගති ලක්ෂණ එම සාමික්ෂණ වල නිරවද්‍යතාවය නිර්ණය කිරීම අපහසු කරයි. එවන් ප්‍රදේශයන් වල භූගත ජලය ප්‍රමාණාත්මකව පවතින බව අදාල පරික්ෂණයන් මගින් පෙන්නුම් කලද නල ලිං ඉදිකළ විට එම ස්ථානවල භූගත ජලය අවශ්‍ය ප්‍රමාණයට නොපවතින අවස්ථාද පවතී.
	(ආ)	සමාලෝචිත වර්ෂය තුළ ජල සම්පත් මණ්ඩලයෙහි අනුරාධපුර රසායනාගාරය වෙත පරීක්ෂණ කටයුතු සඳහා යොමු කරන ලද ජල සාම්පල් 360කින් නිමකර තිබුනේ 28ක් පමණි. තවදුරටත් පරීක්ෂණ 332 ක් සිදුකල යුතුව තිබූ බැවින් කාර්යසාධනය ඉතා පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** මෙම ජල සාම්පල් ප්‍රමාණය විශ්ලේෂණය කර අවසන් කිරීම සඳහා 2021 දෙසැම්බර් මස සිට 2022 පෙබරවාරි මස දක්වා සැලසුමක් සකස් කර අදාල රසඥ වෙත උපදෙස් ලබා දුන් අතර , ඒ අනුව එම කටයුතු නියමිත කාලයේදී අවසන් කිරීමට හැකි විය.

	(ඇ)	කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඉන්දියානු ආධාර නිවාස ව්‍යෘපෘතිය මගින් නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්කයන්හි වතු නිවාස ආශ්‍රිතව නළ ලිං 6 ක් ඉදි කිරීම සඳහා රු.6,095,000 ක මුදලක් 2020 වර්ෂයේදී මණ්ඩලය වෙත ගෙවා තිබුණි. ඉදිකරන ලද නල ලිං 03 ක් අසාර්ථක වීම හේතුවෙන් ඊට අදාල මුදල වූ රු. 2,883,000 ක් නැවත ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව මණ්ඩලයට පාඩුවක් සිදු වී තිබුණු අතර නල ලිං ඉදිකිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කළ මණ්ඩලයේ භූජල විද්‍යාඥයන් වසේ කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** මෙම ව්‍යාපෘති යටතේ නල ළිං 06ක් ඉදිකර ඇති අතර ඉන් නල ළිං 02ක් පමණක් ප්‍රමාණවත් තරම් ජලය නොමැති වීම නිසා අසාර්ථක වී ඇත. එක් ස්ථානයක නල ළිඳ ඉදිකිරීමට අවශ්‍ය මාර්ගය සකසා නොමැති බැවින් (නල ළිඳ ඉදිකිරීමට ප්‍රථම අදාල මාර්ගය විදුම් යන්ත්‍ර වලට ළඟාවීමට හැකි පරිදි සකස් කලයුතු බව භූජල විද්‍යා සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇත.) ළිඳ ඉදිකර නොමැත.කෙසේ වුවද, ජලය ප්‍රමාණවත් නොවූ නල ළිං දෙකෙහි විදුම් වාර්තා හා පස් සාම්පල් පරීක්ෂා කල අතර එහිදි අනාවරණය වූයේ භූජල විද්‍යා සමීක්ෂණයේදි පෙන්නුම් කරන ලද පැලුම් කලාප වල මැටි හා මිනිරන් බණිජ තැන්පත් වීම මඟින් ජල මාර්ග අවහිරව තිබූ බවය. කෙසේ වුවද, ඉදිරියේදි මෙවැනි තත්වයන් මඟ හරවා ගැනීමට කටයුතු කරන ලෙස අදාල භූ විද්‍යාඥයින්ට උපදෙස් ලබාදෙන ලදි.
	(ඈ)	අනුරාධපුර පලාත් කාර්යාලයේ ස්ථාපිත කරන ලද රසායනාගාරය වෙත සපයා තිබූ භූගත ජලයේ පවතින කෘෂි රසායනයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගන්නා රු.32,535,430 ක් වටිනා GC MS -MS යන උපකරණය සැපයූ දින සිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි එකී උපකරණය සැපයුම්කාර සමාගම (Analytical Instrument (Pvt) Ltd) විසින් ලබා දී තිබූ වර්ෂයක වගකීම් කාලය (2018.08.09 සිට 2019.08.08) තුළ එය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. ජලයේ පවතින කෘෂි රසායන සංයුතිය විශ්ලේෂණය කළ හැකි වෙනත් කිසිදු උපකරණයක් ජල සම්පත් මණ්ඩලය සතුව නොතිබුණ තත්ත්වයක් යටතේ මෙකී උපකරණය ප්‍රයෝජනයන් රහිත උපකරණයක් ලෙස සලකා වෙනත් ව්‍යාපෘතියකට ලබා දීමට සභාපතිවරයා කටයුතු කර තිබීම විගණනයේදී ගැටළු සහගත තත්වයක් විය.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** රුපියල් මිලියන 32,535,430 ක් වටිනා (GCMSMS) උපකරණ මේ වන විට ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති චීන ලංකා පර්යේෂණ ව්‍යාපෘතියට Join Research & Development Demonstration Center for Water Technology (JRDC) භාර දී ඇත. කොටසක් සවි කිරීමට අවශ්‍ය විය. ඒ වන විට වර්ෂයක වගකීම් කාලය අවසන් වී තිබූ බැවින් එම මුදල ජල සම්පත් මණ්ඩලයට දැරීමට සිදු විය. මේ වන විට ජල සම්පත් මණ්ඩලයේ තිබූ මූල්‍ය අපහසුකම් හේතුවෙන් මෙම (GCMSMS) උපකරණය JRDC ව්‍යාපෘතියට ලබා දීමට ජල සම්පත් මණ්ඩල කළමණාකාරිත්වය තීරණය කරන ලදී. ජලයේ පවතින කෘෂි රසායනික සංයුතිය විශ්ලේෂණය කිරීමට අදාල (GCMSMS) උපකරණය ඉතා අධි තාක්ෂණික සංවේදී උපකරණයක් වන අතර භාවිතයේදී ඒ සඳහාම වූ විශේෂිත වූ රසායන ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ අවශ්‍ය වේ. නමුත් මෙවැනි වටිනා උපකරණයක් නඩත්තු කිරීමට හා විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන යාමට මූල්‍යමය හැකියාවක් මෙම අවස්ථාවේදී ජල සම්පත් මණ්ඩලය සතුව නොපැවතීම නිසාත් රුපියල් 3,820,129.56 වටිනාකමකින් යුතු

			කොටසක් නැවත සවි කිරීමට සිදු වීම නිසාත් රටේ බහුතර පොදු ජනතාවට වඩාත් ප්‍රතිඵලදායක වන ව්‍යාපෘති සඳහා යොදවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය තබමින් ජල සම්පාදන අමාත්‍යාංශයටම අනුබද්ධිත චීන ලංකා පර්යේෂණ ව්‍යාපෘතියට සභාපතිතුමා විසින් භාර දීමට තීරණය කරන ලදී.
	(උ)	ජල සම්පත් මණ්ඩල පණත සංශෝධනය කිරීම සඳහා 2021 ජූලි 12 දින අමාත්‍ය මණ්ඩලය නියෝග කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අදාල කෙටුම්පත නීතිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. පණත සංශෝධනය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා පණත සංශෝධනය කිරීමේ අරමුණ ලෙස හඳුනාගෙන ඇති වැරදි සහ ඊට අදාල දඩුවම් පැමිණිවිමේදී පැන නගින ගැටළු සහ භූගත ජලය අවභාවිතා කිරීම හා අසීමාන්තික ලෙස උකහා ගැනීමේ ගැටළු සම්බන්ධ ක්‍රියා මාර්ග ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කර අමාත්‍යාංශයට යොමු කර ඇති අතර ඒ අනුව මෙම සංශෝධිත පනත් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු ගරු ඇමතිතුමන්ලා හා මන්ත්‍රීතුමන්ලා වෙත 2022.02.08 දින ඉදිරිපත් කිරීමට සැළසුම් කල අතර කෙසේ වුවද, එම දින වල රටේ පැවැති කොවිඩ් 19 තත්වය මත එදින එය ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේදි අමාත්‍යාංශ ලෙක්මිතුමා සමඟ සාකච්ඡා කර සංශෝධිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අතර, ඉන් අනතුරුව නීතිපතිවරයාගේ නිශ්කාෂන ලබා ගැනීමට සඳහා සැළසුම් සකස් කොට ඇත.
	(ඌ)	ජල සම්පත් මණ්ඩලය සතුව විදුම් යන්ත්‍ර 16 ක් පැවති අතර ඉන් 03 අක්‍රීය තත්වයේ පැවතීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට අපහරණය කිරීමට සැලසුම් කොට තිබුණද මෙතෙක් අපහරණය කොට නොතිබුණි. විදුම් යන්ත්‍ර 05ක් අලුත් වැඩියා කලයුතු තත්වයේ පැවතියද මෙතෙක් අදාල කටයුතු අවසන් කොට නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල විදුම් යන්ත්‍ර 08ක් පමණක් සේවයේ යොදවා තිබුණි. 2021 වර්ෂයේ නළ ළිං 80ක් පමණක් ඉදි කර තිබූ අතර ඒ අනුව විදුම් අංශයේ කාර්ය සාධනය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** රටේ පැවති කෝවිඩ් තත්වය යටතේ නල ලිං විදුම් සඳහා ඉල්ලීම් විශාල ලෙස ලැබී නොතිබුණි. එසේම පැවති කෝවිඩ් තත්වය හමුවේ ජ.ස.ම. මුදල් ගෙවා තිබූ නල ලිං 80 ක් 2021 වසරේ ඉදි කරන ලදී. 2021 වර්ෂයේ අවසන් වන විට නල ලිං විදීමට ලැබී තිබූ ඉතිරි ප්‍රමාණය ජනවාරි මස සහ පෙබරවාරි මස ඉදි කරන ලදී. එම ප්‍රමාණය නල ලිං 20 කි. විදුම් යන්ත්‍ර අළුත් වැඩියාව සඳහා කටයුතු කරමින් පවතින අමතර කොටස් හිගතාවය නිසා සහ කෝවිඩ් තත්වය හමුවේ එය ප්‍රමාද බවක් පවතී. අපහරණය කළ යුතු විදුම් යන්ත්‍ර පිළිබඳව තීරණයක් ගෙන නැවත අපහරණය සඳහා ටෙන්ඩර් කළ යුතු වේ.

	(ඒ)	ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කලමණාකරණය කිරීම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සකස් කරන ලද ව්‍යාපෘති යොජනාවක් පදනම් කොට ගෙන, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2015 ජූලි මස 10 දින අංක 05/2015 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රථමයෙන් වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නෙදර්ලන්තයේ රෝයල් අයිකල් කෑම්ප් (Eijkelkamp Earth Sampling Group) ආයතනය වෙත යූරෝ 20,629,921 පිරිවැයක් මත පිරිනැමීම සඳහා 2017 ඔක්තෝම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ යූරෝ 2,240,030 ක් හෙවත් රුපියල් මිලියන 393.976 ක් වටිනා අධි තාක්ෂණික විදුම් යන්ත්‍රරූ (MS - FT Drilling rig mountel truck) 02 ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු මෙම යන්ත්‍ර 02 ක ජල සම්පත් මණ්ඩලයට පවරාදීමට නියමිතව තිබුණද එම යන්ත්‍ර ක්‍රියාකරවීමට අවශ්‍ය පුහුණුව ලබා දී නොතිබිණි. එසේ වුවද මේ වන තෙක් එම යන්ත්‍ර භාරගෙන ක්‍රියා කිරීමට අවශ්‍ය නිලධාරීන් හදුනාගෙන ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීමට කිසිදු ක්‍රියාමාර්ග යක් ගෙන නොතිබුණි. ව්‍යාපෘතිය යටතේ යෝජිත දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යූරෝ 1,033,928 ක් වෙන් කර තිබුණද වර්ෂ 4 ක් ගත වුවද අදාල ගොඩනැගිල්ල ඉදි කර නොතිබිණි. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම තුළ ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** ව්‍යාපෘතිය යටතේ භාවිතයේ යොදවා තිබෙන විදුම් යන්ත්‍ර දෙකක පුහුණුව සඳහා පුහුණු කිරීමට ජල සම්පත් මණ්ඩලයේ විදුම් නිලධාරීන් යොමුකරන ලෙස නොයෙක් අවස්ථාවන්හිදී ඉල්ලීම් ඉදිරිපත් කළ ද ප්‍රමාණවත් විදුම් නිලධාරීන් නොමැති වීම සහ යම් අවස්ථාවන්හිදී පුහුණුව සඳහා නම්කර එවන නිලධාරීන් දීමනා ඉල්ලා සිටීම වැනි ගැටළු නිසා පුහුණුවට නොපැමිණීම ආදී කරුණු හේතුවෙන් එම පුහුණුව ලබා දීම ප්‍රමාද විය. එමෙන්ම, එම පුහුණුව ලබාදීම සඳහා නෙදර්ලන්ත විදුම් කාර්ය මණ්ඩල වසර 1 ½ කට අධික කාලයක් දිවයිනට නොපැමිණීම හේතුවෙන් (කොවිඩ් තත්වය මත සංචාරක සීමා පැණවීම හේතුවෙන්) පුහුණු කටයුතුවල ප්‍රමාදයක් සිදු විය. කෙසේ නමුත් පුත්තලම දිස්ත්‍රික්කයේ විදුම් කටයුතු ආරම්භ කරන ලද 2022.01.01 දින සිට ජල සම්පත් මණ්ඩලයේ විදුම් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීනව යොදවා පුහුණු කළ අතර ඔවුන් දෙදෙනා ඉතා ඉක්මනින් අදාල නිපුණත්වය ලබාගත් බව නෙදර්ලන්ත විදුම් කාර්ය මණ්ඩලය වාර්තා කර ඇත. ඔවුන් දෙදෙනාම මේ වනවිට නෙදර්ලන්ත විශේෂඥ සහය නොමැතිව විදුම් කටයුතු සිදුකිරීමේ හැකියාව ලබා ඇත. කෙසේ නමුත් මල්වතු ඔය ගංගා ද්‍රෝණියේ විදුම් කටයුතු ආරම්භයේදීම සිදුකල පුහුණු සැසි සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් නම් කරන ලද විදුම් නිලධාරීන් කිහිපදෙනෙකු පමණක් පැවැති විදුම් නිලධාරී හිඟය සහ ජල සම්පත් මණ්ඩලයේ විදුම් කටයුතු හේතුවෙන් සහභාගි විය. මොවුන් දෙදෙනාගෙන් පුහුණුවෙන් පසු ජල සම්පත් මණ්ඩලයෙහි තවත් විදුම් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීන විදුම් කටයුතු සඳහා නෙදර්ලන්ත විශේෂඥ සහාය ඇතුව මේ වන විට යොදවා ඇත. ව්‍යාපෘති ගිවිසුම අනුව දත්ත මධ්‍යස්ථානය සඳහා ජල සම්පත් මණ්ඩල කාර්යාලය පිහිටි හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ වර්ග අඩි 6000ක ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. කෙසේ නමුත් ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු කළ බැවින් ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි පර්චස් 40ක ඉඩම රජයේ ප්‍රධාන

			තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන නාමික බදු කුලියක් අය කිරීමේ පදනම මත ජල සම්පත් මණ්ඩලයට ලබාදීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබුණ ද එම ඉඩම විධිමත් පරිදි ජල සම්පත් මණ්ඩලයට පවරා දී නොතිබුණු අතර රජයේ ප්‍රධාන තක්සේරුකර විසින් මේ සඳහා තක්සේරුව ලබා ගැනීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද කරන ලදී. ඒ අනුව ගිවිසුමක් අත්සන් කිරීමේ කටයුතු නියමිත කාලයේදී සිදු නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි සැලැස්ම සකස් කිරීමට කොන්ත්‍රාත්කරුට හැකියාවක් නොතිබුණි. දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අමතරව ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා ද මෙම ගොඩනැගිල්ල ව.අඩි 24,000ක ප්‍රමාණයට සැලසුම් කර, එයින් ව. අඩි. 18,000 ක ඉදිකිරීම් කටයුතු ප්‍රථම අදියර යටතේ අවසන් කිරීමට තීරණය කළ බැවින් අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වීම හේතුවෙන් අසම්භාව්‍ය වෙන් කිරීම් (Provisional sum) යටතේ යූරෝ 439,539.00 ක් වෙන් කරන ලදී. අදාල සැලසුම් සියල්ල මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇතත්, අවම වශයෙන් කුලී සින්නක්කර ගිවිසුම පවා මේ වන තුරුත් ලබා දී නොමැත.තවද මේ වන විට රටෙහි ඇතිව තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතියේ අනුමත ප්‍රතිපාදිත මුදලින් සිදුකිරීම අසීරු වී ඇති හෙයින් (ඇස්තමේන්තුගත මුදල 2022.03.15 දින වන විට රු.මි. 840) අවම අවශ්‍යතා සපුරාලීම් යටතේ ගොඩනැගිල්ලක් මෙම ප්‍රතිපාදන හරහා ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මේ වන විට වාරිමාර්ග හා ජල කළමණාකරන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කෙසේ නමුත් මේ වන විටත් දත්ත මධ්‍යස්ථානයක් රත්මලාන ව්‍යාපෘති කාර්යාලයෙහි ස්ථාපිත කර ඇති බැවින් ව්‍යාපෘතියෙහි අරමුණුවලට කිසිදු අහිතකර බලපෑමක් සිදු වී නොමැත.

2021 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතීන්හි ප්‍රගතියේ සාරංශය

(1). භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල නිමාන ව්‍යාපෘති සහ අධ්‍යයනය

1.1. භූගත ජල කළමනාකරණයට අවශ්‍ය දිගු කාලීන දත්ත එක් රැස් කිරීම සඳහා වූ වැඩසටහන (LTGM) (රු. මිලියන 3.0)

මෙම ව්‍යාපෘතියට අදාල 2021 වර්ෂයේ ඉලක්කය සහ ප්‍රගතිය පහත පරිදි වේ.

අධ්‍යයන ප්‍රදේශය	අධ්‍යයන ප්‍රදේශය	2021 ඉලක්කය	2021 ප්‍රගතිය
කොළඹ - මිගමුව අනුරාධපුර මන්නාරම වවුනියා-කිලිනොච්චි යාපනය සහ දූපත් පුත්තලම කැළණි ගඟ- ඉහළ ද්‍රෝණිය කැළණි ගඟ- පහළ ද්‍රෝණිය මොණරාගල පොළොන්නරුව ත්‍රිකුණාමලය කිරිදි ඔය අම්පාර මාතලේ	භූගත ජල නිමානය සහ ජල සාම්පල ස්ථානීයව පරීක්ෂා කිරීම (ස්ථාන 3400) සහ ජල සාම්පල එකතු කිරීම (පුර්ණ රසායනික විශ්ලේෂණ - නියැදි 1720 හා බැර ලෝහ විශ්ලේෂණය - නියැදි 395	3400 (ස්ථාන) 1720 (නියැදි) 395 (නියැදි)	74%
	ද්වි වාර්ෂික පුර්ණ ජල සාම්පල විශ්ලේෂණයසහ බැර ලෝහ විශ්ලේෂණය	1720 (නියැදි) 395 (නියැදි)	26%
	දත්ත විශ්ලේෂණය හා වාර්ෂික වාර්තා සැකසීම		60%

1.2. ශ්‍රී ලංකාවේ වෙරළබඩ භූගත ජලධර පද්ධතියට දේශගුණික විපර්යාස කෙරෙහි සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳ අධ්‍යයනය (රු. මිලියන 2.0)

මෙම ව්‍යාපෘතියට අදාල 2021 වර්ෂයේ ඉලක්කය සහ ප්‍රගතිය පහත පරිදි වේ.

අධ්‍යයන ප්‍රදේශය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
■ කොළඹ සිට ගාල්ල වෙරළබඩ භූගත ජලධරය	භූ ජල සමීක්ෂණ සිදු කිරීම (10) සහ පරීක්ෂණ නල ළිං ඉදිකිරීම (10)	10	90%
■ ත්‍රිකුණාමලය - මුලතිව් වෙරළබඩ භූගත ජලධරය	භූගත ජල නිමානය සහ ජල සාම්පල ස්ථානීයව පරීක්ෂා කිරීම (ස්ථාන 260) සහ ජල සාම්පල එකතු කිරීම (පුර්ණ රසායනික විශ්ලේෂණ - නියැදි 130 හා බැර ලෝහ විශ්ලේෂණය - නියැදි 30)	260 (නියැදි) 130 (නියැදි) 30 (නියැදි)	71%
	ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම (10)	10	40%
	ද්වි වාර්ෂික පුර්ණ ජල සාම්පල විශ්ලේෂණය (130)සහ බැර ලෝහ විශ්ලේෂණය (30)	130 (නියැදි) 30 (නියැදි)	50%

1.3. මා ඔය ගංගා ද්‍රෝණියේ ජලධර ප්‍රතිආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම සඳහා සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යනය (රු. මිලියන 2.5)

මෙම ව්‍යාපෘතියට අදාල 2021 වර්ෂයේ ඉලක්කය සහ ප්‍රගතිය පහත පරිදි වේ.

අධ්‍යයන ප්‍රදේශය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
■ මා ඔය ගංගා ද්‍රෝණියේ ජලධර ප්‍රතිආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම සඳහා සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යනය	මූලික අධ්‍යයනය (දත්ත එකතු කිරීම) සහ මා ඔය ද්‍රෝණියට අදාළ සිතියම් සකස් කිරීම		100 %
	ත්‍රෛමාසික ජල මට්ටම අධීක්ෂණය සහ විශ්ලේෂණය (260), ද්විවාර්ෂික ජල නියැදීම (රසායනික විශ්ලේෂණය සඳහා 130 සහ බැර ලෝහ විශ්ලේෂණය සඳහා 30)	260 (ස්ථාන) 130 (නියැදි) 30 (නියැදි)	80%
	ජලධර ව්‍යාප්තිය සහ භූගත ජල විභවයන් හඳුනා ගැනීම සඳහා භූ භෞතික විද්‍යා සමීක්ෂණ සිදු කිරීම (1D - 50, සහ 2D - 10)	50 (D) 10 (2D)	90%
	පරීක්ෂණ නළ ළිං ඉදි කිරීම (15)	15	-
	ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම (10) සහ ජලධර නැවත ආරෝපණය කිරීම සඳහා හිතකර කලාප හඳුනා ගැනීම	10	-
	රසායනික විශ්ලේෂණය (රසායනික -150 සහ බැර ලෝහ 30)	150 30	-
	දත්ත විශ්ලේෂණය හා වාර්ෂික වාර්තා සැකසීම		30%

1.4. භූගත ජලයට අදාල පාරිසරික ගැටළු විසඳීම අවශ්‍ය ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම (රු. මිලියන 1.5)

මෙම ව්‍යාපෘතියට අදාල 2021 වර්ෂයේ ඉලක්කය සහ ප්‍රගතිය පහත පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
01	ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ හා පාරසරික ගැටළුවලට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම්	100	117%
02	භූගත ජල නියාමනයන්ට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	25	28%

1.5. විද්‍යාත්මක හා වෙනත් ප්‍රාග්ධන කටයුතු වැඩි දියුණු කිරීම - (රු. මිලියන 4.0)

ඉහත වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් හා ඉලක්ක සම්පූර්ණ කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
01	ක්ෂේත්‍රයට ගෙන යා හැකි විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම - Portable multi parameter	01 කි	100%
02	ජල ධාරිතා පරීක්ෂණ සඳහා උපකරණ මිලදී ගැනීම - Submersible pumps	03 කි	85%
03	රසායනාගාර හා භූ භෞතික උපකරණ නඩත්තු කිරීම	-	100%
04	ජල මට්ටම් මිනුම් කිරීම් උපකරණ මිලදී ගැනීම - portable water level recorder	02 කි	100%

1.6. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් (රු. මිලියන 1.0)

ඉහත වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් හා ඉලක්ක සම්පූර්ණ කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 ප්‍රගතිය
01	WRB කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන	18%

1.7. ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම - (රු. මිලියන 6.0)

ඉහත වැඩසටහන යටතේ පුත්තලම සහ අනුරාධපුර පළාත් කාර්යාලවල පහත වගුවේ පරිදි අදාල වැඩසටහන් සිදු කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 ප්‍රගතිය
01	යන්ත්‍ර අළුත් වැඩියා කිරීම්	10%
02	අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ වහල අළුත් වැඩියා කිරීම	50%
03	අනුරාධපුර පුහුණු මධ්‍යස්ථානයේ නිවස අළුත් වැඩියා කිරීම	60%
04	පුත්තලම පළාත් කාර්යාලයේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම	50%

(2). අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සිදු කරන භූගත ජල සංවර්ධන ව්‍යාපෘතිය

2.1 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ හා සංරක්ෂණ සැලැස්ම සකස් කිරීම අදියර I සහ II (යාපනය අර්ධද්වීපයේ ළිං ඉන්වෙන්ටර් සකස් කිරීම සහ ජල විද්‍යාත්මක තක්සේරුව) - (රු. මිලියන 2.34)

ඉහත වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් හා ඉලක්ක සම්පූර්ණ කර ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 ප්‍රගතිය
01	භූගත ජල මට්ටම් මිනුම් කිරීම හා දත්ත එකතු කිරීම (පාසල් අවසන් කල සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ සහාය ඇතිව සිදු කරනු ලැබේ.)	128%
02	භූගත ජල ප්‍රභවයන් (නල ළිං සහ නොගැඹුරු වල ළිං) පරීක්ෂා කර අදාල දත්තයන් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම	80%
03	වාර්තාව සකස් කිරීම	75%
04	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	30%

2.2. යාන් ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය (රු. මිලියන 0.20)

මෙම අධ්‍යයනය යටතේ 2021 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 ප්‍රගතිය
01	ජල නියැදී එකතු කිරීම (110), ජල මට්ටම මිනුම් කිරීම හා ස්ථානීය ජල නියැදි විශ්ලේෂණය (600)	44%
02	දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය	15%

2.3. මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය (රු. මිලියන 0.23)

මෙම අධ්‍යයනය යටතේ 2021 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 ප්‍රගතිය
01	ජල නියැදී එකතු කිරීම (110), ජල මට්ටම මිනුම් කිරීම හා ස්ථානීය ජල නියැදි විශ්ලේෂණය (600)	41%
02	දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය	15%

(3) උත්පාදිත අරමුදල් ඉපැයීම සඳහා සිදු කරන ලද වාණිජ්‍ය ක්‍රියාකාරකම්

3.1. භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් - (රු. මිලියන 61.45)

2021 වර්ෂයට අදාල ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
01	භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ	300	106%
02	නල ළිං ඉදිකිරීම	100	34%
03	පොම්ප පරීක්ෂණ	150	79%
04	නල ළිං පිරිසිදු කිරීම	05	40%
05	ජල සාම්පල විශ්ලේෂණය	400	84%

3.2. භූගත ජල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම - (රු. මිලියන 9.3)

2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකරකම් වල වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	2021 වර්ෂයේ ඉලක්කය	2021 ප්‍රගතිය
01	බාහිර භූ ජල විද්‍යාඥයන් ලියාපදිංචි කිරීම	20	70%
02	පුද්ගලික විදුම් ආයතන ලියාපදිංචි කිරීම	140	70%
03	බාහිර භූ ජල සමීක්ෂණ වාර්තා අනුමත කිරීම	800	83%
04	Flow meters සවි කිරීම	20	25%

විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් හා විගණන වාර්තා වල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග

1. විගණනයෙන් පෙන්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

2. භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් අනවශ්‍ය තොග හඳුනාගැනීම සිදු කර ඇති අතර ඒවා අපහරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

3. 2010/23 සහ 2017.03.16 දිනැති ගැසට් පත්‍රයට අනුව භූ ගත ජල නියාමන කටයුතු තවදුරටත් විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු ආරම්භ කර ඇත.

4. ජල සම්පත් මණ්ඩලයේ පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත බඳවා ගැනීමට කටයුතු කර ඇත.

5. පර්යේෂණ අධ්‍යන කටයුතු තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කර ඇත.

6. විවිධ ව්‍යාපෘති ප්‍රධාන යටතේ ජල සම්පත් මණ්ඩලය වෙත ලැබී ඇති ආයතනයේ කටයුතු සඳහා උපයෝගී නොවන උපකරණ අවශ්‍යතාවය පවතින වෙනත් රාජ්‍ය ආයතන වලට විධිමත්ව පවරා දීමට කටයුතු කර ඇත.

7. අනුරාධපුර රසායනාගාරයේ කටයුතු තවදුරටත් විධිමත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

ජල සම්පත් මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂය තුලදී ගන්නා ලද ක්‍රියාමාර්ග

1. රට තුල පවතින භූ ගත ජලය කළමනාකරණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම හා එය ක්‍රියාවට නැංවීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට කටයුතු යෙදීම.

2. අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර රසායනාගාර කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

3. ස්ථාවර වත්කම් කළමනාකරණය සහ පාලනය වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මෘදුකාංග යොදා ගැනීම තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

4. අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර, යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.

5. මණ්ඩලයේ කටයුතු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සම්පාදනය කිරීම.

6. කාර්ය මණ්ඩලයට අවශ්‍ය කළමනාකරණ සහ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා පුහුණු වීම් ලබා දීම.

7. මණ්ඩලයේ සියලුම අංශ වල ප්‍රගතිය මාසිකව පරීක්ෂා කිරීම.

8. මණ්ඩලයේ සියලුම කටයුතු පිළිබඳව පසු විපරම් කිරීම.